පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

යහපත් වූ වරායක නත්තල් දැක්ම

හයවන කාණ්ඩය / 05 වන කලාපය / 2019 ජූනි


04 පිටුව
පරමාණු ප්‍රවාහන හා සැපයුම් වෙළඳ ප්‍රදර්ශනයට කොළඹ වරායත්

05 පිටුව
මොන ම තත්ත්වය යටතේවත් නැගෙනහිර පර්යන්තයේ පාලනය පිට ට යන්නේ නැහැ

07 පිටුව
වරාය ජාතික සේවක සංගමයේ සභාපති වරාය අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ධුරයකට

12-13 පිටුව
වරාය යාත්‍රා අධිකාරි අංශයට..

14 පිටුව
තරු පහේ පුස්තකාලය




# නැගෙනහිර පර්යන්තයේ පූර්ණ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට

Con. 03


තීර්ථ

මිනිසුන් බොරු කරන්නේ ද? බොරු කියන්නේ ද? වාසි බලාපොරොත්තුවෙනි. ඇත්ත මිල අධික වන අතර, බොරුව ඉතා ම ලාභය. ඕනෑම තැනක අලෙවි වන බැවින් බොරුව ජාවාරම් කිරීම ඕනෑම කෙනෙකුට පහසු දෙයකි. කාර්යාලයක වේවා, වැඩබිමක වේවා මග තොටේ වේවා බොරුවට පළමු තැන හිමිවනු දැකිය හැකි ය. ව්‍යාපාර පවා අද තමන්ගේ ව්‍යාපාර කරන්නේ බොරුව මුල් කරගෙන ය. සම්මාන උළෙලක දී සම්මාන පවා මුදලට විකිණෙන, බොරුව අදහන සමාජයක අද දවසේ අපි ජීවත් වන්නෙමු. බැලූ බැලූ අත දක්නට ඇත්තේ බොරුවෙන් රජයන ලෝකයකි. එනම් විශ්වාසය බිඳ වැටුණු, අනෙකා සැක කරන සමාජයක් නිර්මාණය වීමකි. අන්තර් පුද්ගල සබඳතා තහවරු කර ගැනීමේ දී එහි පදනම වනුයේ විශ්වාසයයි. බොරුව ඇති තැන විශ්වාසය තිබිය නොහැකි ය. අනාවරණ නොවන තාක් කල් බොරුව ඇත්ත සේ මවා පාමින් සම්බන්ධතා පවත්වා ගිය ද දියේ එබූ රබර් බෝලයක් උඩ මතු වෙන්නා සේ බොරුව යට ගොස් ඇත්ත උඩ ආ දවසට ඒ සම්බන්ධකම් සියල්ල හමාර ය. බොරුව කිසිදා ඇත්ත කළ නොහැකිවා මෙන් ම බිඳ වැටුණු විශ්වාසය ද නැවත කිසිද දා ඒ තිබූ මට්ටම ට පිළිසකර කළ නොහැක.

ඇතැම් ව්‍යාපාර අද තරගය ජය ගැනීමට උත්සුක වන්නේ බොරුවෙනි. අනෙකාට වඩා ඉදිරියට යෑමට බොරුව භාවිත කරන්නට තරම් මිනිසුන් පහත් මට්ටමට වැටී තිබීම කණගාටුවට කරුණකි. බොරුවෙන් දිනන්නේ කායික වශයෙනුත්, මානසික වශයෙනුත් ශක්තිමත් උදවිය නොව සෑම අංශයකින් ම දුර්වල අයවළුන් බැව් සිහියේ තබා ගැනීම යුක්ති යුක්ත වන්නේ ය. බොරුවෙන් වැඩ ගන්නා මිනිසුන් සැමදාමත් බොරුව පවතිනවාට කැමති වීම පුදුමයක් නොවේ. එහෙත් අප පුදුම විය යුත්තේ මිනිසුන් ඒ බොරු වල ට හැමදාමත් රැවටීම ය. රැවටුණු වලේ දවල් වැටෙන්නට එපා යැයි අපේ පැරැන්නන් කොතෙක් ඔවා දුන්න ද, බොරුව වෙත ලංව බොරුවෙන් ම ලොව දිනීමට උත්සුක වන අය සිහිපත් කර ගත යුතු කාරණා බොහෝ ය. මෙහි දී අවධානය යොමු කළ යුතු ම කරුණ වන්නේ අනුන් රැවටීමෙන් අනුන්ට බොරු කරන තත්ත්වයට පත් වී තිබී ම ය. බොරු කිරීම් බරපතල ම අදියර වන්නේ අනුන් විසින් තමන් රැවටීමට වඩා තමන් විසින් ම තමන් රවටා ගැනීමට පෙළඹීම ය. සැබැවින් ම එය අපරාධයක් වැනි ය. එසේ හඳුන්වන්නේ එයින් සිදුවන හානිය අතිශයනි ම ප්‍රබල බැවිනි. තවකෙක් තමන් රැවටීමට ගන්නා වෑයමක දී තමන්ගේ මතය විවෘතව තබා ගැනීමෙන් එවැනි ගැටළු වලින් මිදීමට මග පෑදේ. එහෙත් තමන් ම රවටන විටෙක දී එහි අනර්ථය තේරුම් කර දීමට කිසිවෙකු නොමැත.

කෙනෙකු තමන් ම රවටා ගන්නේ කෙසේ ද? අපි ඒ ගැන කතා කරමු. යමක් කරන්නට පටන් ගත් විට ඒ වෙනුවෙන් ඔබේ සිතේ කොපමණ නිදහසට කරුණු ඉදිරිපත් වෙනවා ද? ඒවායෙන් කීයක් නම් සැබෑවට ම සත්‍ය ඒවා ද? ඔබ යමක් කරන්නට පටන් ගන්නේ ඔබට එය කළ හැකි බව ට ඔබ තුළ පවතින විශ්වාසය හේතුවෙනි. කිසිවෙකුගේ බොරුවක ට රැවටී ඔබේ ඒ විශ්වාසය නැතිකර ගත යුතු ද යන්න පිළිබඳව ද ඔබ නැවත නැවත සිහිපත් කළ යුතු ය. එසේ අතරමග නතර කිරීමටත්, ඔබ කරන්නේ ඔබව ම රවටා ගැනීමකි. එසේ රැවටීමෙන් ඔබ අඩාල කර ගන්නේ ඔබේ ම ඉදිරි ගමන බැව් අමතක නොකළ යුතු ය. තමන් රවටා ගැනීම යනු තමන්ගේ හෘද සාක්ෂිය රවටා ගැනීමකි.

බොරුව තුළ විශ්වාසය නැත. විශ්වාසය ඇත්තේ ඇත්ත තුළ ය. සත්‍යවාදී මිනිසෙකු වීමෙන් ඔබ බහුතරයක් දෙනා සතුව නොමැති ගුණයක් ඔබ සතු කර ගන්නේ ය. ඒ ඔස්සේ ඔබ ට ඔබේ වටිනාකම් වැඩිකර ඔබ ට, ඔබේ පවුලට, ආයතනය ට මතු නොව රට ට වැඩදායී පුරවැසියෙක් බව ට පත් වි ය හැකි ය.



## සාමූහිකත්ව ප්‍රවේශය

**කළමණාකරණ කර්තෘ**
නලින් අපොන්සු

**නිරීක්ෂණය**
චිත්‍රාල් ජයවර්ණ
නිලන්ත ඉලංගමුව
හර්ෂ උදයකාන්ත පීරිස්
කාව්‍ය ඉන්ද්‍රජිත්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගණක අකුරු ඇමුණුම**
රේණුකා දමයන්ති

**තාක්ෂණික සහාය**
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ

**ඡායාරූප**
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි
සන්ධ්‍යා විතාන
එම්.එෆ්.එෆ්. ෆර්සානා

**ශ්‍රී ලංකා වරාය අධිකාරිය**
**සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශනයකි**

# වරායේ ආරක්ෂාව



මේ දේශයේ ආර්ථික මර්මස්ථානයක සේවය කිරීම බොහෝම භාරදූර කාර්යයක්. කොළඹ වරාය, වරාය ඇස ගැටෙන මානයේම පිහිටි කොච්චිකඩේ ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානයේ සිදුවූ ම්ලේච්ඡ ප්‍රහාරය ගැන සිහිවෙන විට අදටත් ඇඟ සීතල වෙනවා. ආහාර ගන්නා මොහොතකදී, ආගම සිහිකරන මොහොතක දී තවත් අයෙකුගේ ප්‍රාණය නැසීමට යමෙකුට හැකිනම් ඔහු හෝ ඇය තරම් කුරිරු පව්කාර සත්වයෙකු මේ විශ්වයේම නැතිව ඇති. එපමණටම ඔවුන් කෲරයි, අධමයි,... ම්ලේච්ඡයි......
ගෞතම බුදුන් වහන්සේ දේශනා කර වදාල පරිදි,

''අසාරේ සාරමතිනෝ -
සාරේ චාසාරදස්සිනො
තේ සාරං නාධිගච්ඡන්ති -
මිච්ඡාසඞ්කප්ප ගෝචර

එනම්, අසාර වූවෙහි සාරවත් බව දකින්නා වූද, සාරවත් වූවෙහි අසාරවත් බව දකින්නා වූ ද, මිත්‍යා සංකල්ප ගෝචර කරගත් තැනැත්තා සාරයක් නොලබන බවයි.

අද නිවට නියාලු සහජීවනය උසස් කොටගෙන සම්බුද්ධ ශාසනයේ පරම ගාම්භීර අසමසම බව අමතක කරගත්, පන්සල්, දේව මෙහෙයන් කරවන දේවස්ථානයට වැටුණු බාලයන්ගේ අධම ක්‍රියා කලාපය නිසා මුළු රටම විනාශ මුඛයට වැටුණි.

මෙවන් පසුබිමක් තුළ සේවයට පැමිණීම අතුරේ යන්නාක් වැනි වූ ක්‍රියාවක් බඳු වුව ද ආයතනය විසින් සේවක ආරක්ෂාව උදෙසා ගත් ක්‍රියා මාර්ග හේතුවෙන් බියෙන් සැකෙන් තොරව සේවයට පැමිණීමට අප කාහටත් හැකිවීම ආඩම්බරයට කරුණකි.

රටේ ආගමික ස්ථාන හා හෝටල් පරිශ්‍ර වෙත බෝම්බ ප්‍රහාර එල්ල කිරීමත් සමග රටපුරාම ආරක්ෂක කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමට රජය පියවර ගන්නා ලදි. ඊට සමගාමීව වරාය කලමණාකාරීත්වය කොළඹ වරාය ඇතුළු සියලු වරායයන්ගේ ආරක්ෂක කටයුතු තර කිරීම සඳහා පියවර ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. රටක් වශයෙන් අපගේ දෙනෙත් ඉදිරියේ යථාර්තයක් බවට පත් වී ඇති මෙම දරුණු ඛේදවාචකය සහ ත්‍රස්තවාදි ක්‍රියාවලිය නිසා උද්ගත වී ඇති පීඩාකාරි තත්ත්වය පිළිබඳව සියලු සේවක ප්‍රජාව වෙත වූ පීඩනය පිළිබඳ කළමණාකාරීත්වය ස්වකීය සාතිශය සංවේගය පළකිරීමෙන් නොනැවතී වරාය ආරක්ෂාව තර කිරීමට ක්‍රියාමාර්ග ගැනීම සේවක අප සැවොම ලැබූ ජයග්‍රහණය කි.

අධ්‍යක්ෂ (ආරක්ෂක) මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි මහතා ප්‍රමුඛ ආරක්ෂක කොට්ඨාශයේ සියලු නිලධාරි මහත්ම මහත්මීන් මෙහිදී දක් වූ අප්‍රතිහත දායකත්වය අතිමහත් ය. සේවක මහත්ම මහත්මීන් වරාය පරිශ්‍රයට පැමිණීමේ දී ඔවුන්හට හිරිහැරයක් නොවන අයුරින්, සුහදශීලි ලෙසින් කටයුතු කිරීම පැසසුම් සහගත ය.

# ත්‍රස්ත ප්‍රහාරයෙන් විනාශයට පත් ශාන්ත අන්තෝනි දේවස්ථානයට
# ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ඉඩම් ප්‍රදානයක්







පසුගියදා සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් විනාශයට පත් කොටහේන ශාන්ත අන්තෝනි මුණිඳුන්ගේ දේවස්ථානය වෙත ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ප්‍රදානය කළ භූමි ප්‍රදේශයට අදාල ඔප්පු පිරිනැමීම එම දේවස්ථාන පරිශ්‍රයේ දී පසුගිය දා සිදු කෙරුණි. වරාය හා නාවික ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා විසින් එම ඔප්පු අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් පියතුමා වෙත පිරිනැමීම සිදුවිය.

එම පරිශ්‍රයේ ඉදිවන නව ඉදිකිරීම් කටයුතු සඳහා මුල්ගල් තැබීම ද එහිදී සිදුවිය. රොමයේ පාප් වහන්සේ විශේෂ නියෝජිත අතිඋතුම් ෆනැන්ඩෝ කාදිනල් හිමිපාණන්, අතිඋතුම් කාදිනල් රංජිත් හිමිපාණන් සහ අපෝස්තලික තානාපති අතිඋතුම් පියෙර්නුවෙන් වැන් ටොට් අගරදගුරු හිමිපාණන් සහ වරාය හා නාවික ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා ඇතුළු අමාත්‍යවරුන් රැසකගේ දායකත්වයෙන් සිදු විය.

01 පිටුවෙන්...

# නැගෙනහිර පර්යන්තයේ පූර්ණ අයිතිය වරාය අධිකාරියට

නැගෙනහිර බහලු පර්යන්තයේ කටයුතු පුළුල් කිරීමත්, ඉතා ඉක්මනින් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහාත් ශ්‍රී ලංකාව, ජපානය හා ඉන්දියාව යන රජයන් මූලිකව සහයෝගිතා ගිවිසුමක් (MOC Memorandum of Cooperation) පසුගියදා අත්සන් කෙරිණි. මෙහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අපේක්ෂාව වන්නේ, යෝජිත සහයෝගිතා ගිවිසුමට අනුව ජාතික අවශ්‍යතාවයන් පවත්වා ගැනීමට හා තවදුරටත් පුළුල් කිරීමක් මෙන්ම, ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමග මනා සබඳතාවයක් ස්ථාපනය කර ගැනීමත් ය. මෙය රජයන් තුනක් අතර අත්සන් කෙරුණු ගිවිසුමක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. ඒ අනුව,

නැගෙනහිර පර්යන්තයේ සම්පූර්ණ අයිතිය සියයට සියයක් (100%) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුවේ.

- එසේම, යෝජිත පර්යන්ත මෙහෙයුම් සමාගමෙහි **(The Terminal Operation Company - TOC)** සියයට පනස් එකක (51%) කොටස් ශ්‍රී ලංකාව සතුවන අතර හවුල් පාර්ශවයන්ට තබා ගත හැකි කොටස් ප්‍රමාණය සියයට හතලිස් නවයක් (49%) පමණි.
- එසේම මේ සඳහා ලබා ගැනීමට අදහස් කරන ජපාන ණය, ශ්‍රී ලංකාවට මෙතෙක් ලැබුණු යහපත්ම ණය කොන්දේසි යටතේ ලැබීමට අපේක්ෂිත ය.
- එසේම සියයට පනස් එකක (51%) කොටස් ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවීම ඉතාම හොඳ පවුල් ගණුදෙනුවලින් එකකි. පර්යන්ත මෙහෙයුම් සමාගමේ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවීම මගින් එය මෑත කාලීනව සිදු වූ හවුල් ගනුදෙණු වලින් හොඳ හවුල් ගනුදෙනුවක් බව සඳහන් කළ හැකිය.
- අදාළ ගිවිසුමෙන් ජාතික අවශ්‍යතා වලට ලබා දී ඇති මූලිකත්වය මනාව පිළිබිඹු කරනු ලබයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අරමුදල් යොදවා සිදු කරන සංවර්ධනය කටයුතු වලට වඩා මෙම ක්‍රමවේදයන් මගින් වඩා වේගවත් සංවර්ධන ශක්‍යතා ළඟා කර ගත හැකි ය.
- එමෙන්ම, කොළඹ වරායේ මෙහෙයවන බහළු මෙහෙයුම් වලින් 80% ක්ම ප්‍රතිනැව්ගත කිරීම වන අතර, එයින් 70% ක් ඉන්දියාව මූලික කොට ගෙන සිදු කරනු ලබයි.
- ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම රැස්වී අත්සන් කරනු ලැබූ සහයෝගිතා ගිවිසුමේ කරුණු ප්‍රකාරව රාජ්‍යයන් ත්‍රිත්වයම එක් වී ඉදිරි කටයුතු සිදුකොට නැගෙනහිර පර්න්තයේ මෙහෙයුම් හැකි වහාම ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව කොළඹ වරායට අවශ්‍ය අලුත් මෙහෙයුම් ධාරිතාවක් එක්වනු ඇත. මේ අනුව ගෝලීය නාවුක ක්ෂේත්‍රයේ ලංකාවේ පැවැත්ම තව තවත් ස්ථායී වන අතර. මෙම සහයෝගීතාව මත පදනම් ව ඇති කරගන්නා අවසාන ගිවිසුම සකස් කිරීම සඳහා තවත් මාස තුනක පමණ කාලයක් ගතවනු ඇත.





නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් පසුගිය දා අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුම පිළිබඳ සභාපතිතුමා විසින් සියළු සේවක මහත්ම මහත්මීන් වෙත යොමු කළ ලිපිය

## මෙවැනි ගිවිසුමක් අවශ්‍ය වන්නේ ඇයි?

- මේ වන විට ලෝකයේ භාණ්ඩ ප්‍රවාහන නෞකාවන් විශාල ප්‍රමාණයේ නෞකා බවට පත් වෙමින් පවතී. එය 45% ක් පමණ ප්‍රමාණයකි. නෞකා සමාගම් එයින් වැඩි ප්‍රමාණයක් යොදවා ඇත්තේ ලංකාව කේන්ද්‍රකරගත් නැගෙනහිර - බටහිර නාවික මාර්ගයේ නාවුක ප්‍රවාහන කටයුතු සඳහා ය. විශාල ප්‍රමාණයේ එනම්, කන්ටේනර් 18,000 සහ 20,000 භාණ්ඩ ප්‍රවාහනය කළ හැකි නෞකා මෙහෙයවිය හැකි ගැඹුර මීටර් 18 ක් පමණ වන එකම පර්යන්තය වන්නේ කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් පර්යන්තය (CICT) පමණි. මේ වන විට එහි මෙහෙයුම් ධාරිතාවය උපරිමයට පැමිණ තිබේ.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පාලනය වන JCT පර්යන්තය ද ගැඹුර අඩු බැවින් හා උපකරණ යල්පැන ගොස් ඇති බැවින් විශාල ප්‍රමාණයේ නැව් මෙහෙයුම් කිරීමේ හැකියාවක් නොමැත. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) පර්යන්තයේ ද මෙහයුම් ධාරිතාවය උපරිමයට පැමිණ තිබේ. මෙම කරුණ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව ගෝලීය නාවුක කේන්ද්‍රයේ කේන්ද්‍රස්ථානය බවට පත්වීමේ දී අවශ්‍ය කරන පහසුකම් හා ධාරිතාවයේ ඉතා කඩිනමින් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඇති වෙමින් පවතී.
- ඒ අනුව කොළඹ වරායේ නැගෙනහිර බහළු පර්යන්තයේ (ECT) මෙහෙයුම් කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කල යුතුව ඇත.

සීඝ්‍රයෙන් වෙනස් වෙමින් ඉතාම තරගකාරි ලෙස ඉදිරියට යන කර්මාන්තයක් වන ගෝලීය නැව් බඩු වෙළඳාමට සරිලන සේ වරාය ධාරිතාවය පුළුල් කිරීම සහ සේවාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම ආදිය කාලානුරූපිව වෙනස්වීම අත්‍යවශය වේ. කොළඹ වරාය තුළ මෙකී අරමුණු හැකි ඉක්මනින් සාක්ෂාත් කර ගැනීම සඳහා, යෝජිත සහයෝගීතා ගිවිසුම ඉතා අර්ථාන්විත පියවරකි.

# කොළඹ වරායේ බහලු මෙහෙයුම් අප්‍රේල් (2019) මසදී 9.1% ප්‍රතිශතයකින් ඉහළට

කොළඹ වරායේ බහළු මෙහෙයුම් ධාරිතාව 9.1%ක් ලෙස වාර්තාවේ. ඒ පසුගිය වර්ෂයේ අප්‍රේල් මසට (2019) සාපේක්ෂව ය. මෙම වර්ධනය ලඟා කර ගැනීම සඳහා කොළඹ වරායේ, ජයබහළු පර්යන්තය(JCT), සවුත් ඒෂියා ගේට්වේ පර්යන්තය (SAGT), කොළඹ අන්තර් ජාතික බහළු පර්යන්තය (CICT) යන පර්යන්ත ත්‍රිත්වය එක්ව කටයුතු කළ අතර, සියලු පර්යන්තයන්ගේ ධාරිතාව මේ වන විට 5.9%ක ප්‍රතිශතයකින් ද වැඩි වී ඇත.

2018 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී කොළඹ වරායේ දී මෙහෙයවන ලද බහලු ප්‍රමාණය ඒකක (TEU) 441.437 වන අතර, එය 2019 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී 482.910 ලෙස වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙහෙයවා ඇති හා අනෙකුත් පර්යන්ත මෙහෙයවා ඇති ප්‍රතිනැව්ගත බහලු (T/S) සංසන්ධනය කිරීමේ දී කොළඹ වරායේ ප්‍රතිනැව්ගත (T/S) බහලු මෙහෙයවීම 8.6% කින් වර්ධනය වී ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් පර්යන්තයන් හි බහළු මෙහෙයවීම 10.5% කින් වර්ධනය වී ඇත.

බහළු මෙහෙයුම් වර්ධනය සඳහා වන ශ්‍රේණිගත කිරීමේ දී 2018 වර්ෂයේ දී, **ලොව හොඳම වරායන් 30 අතර පළමු (01) ස්ථානයට** පත්වීමට කොළඹ වරායට හැකිවිය. එමෙන්ම අන්තර් ජාතික ඇල්ෆාලයිනර් දර්ශකයට අනුව **අන්තර් ජාතික බහළු වරායන්** අතර 2018 වර්ෂයේ දී 22 වන ස්ථානයට පත්වීමට කොළඹ වරායට හැකිවුණේ 13.5% ප්‍රතිශතයක වර්ධනයත් සමගිනි. 2017 වර්ෂයේ දී ඉහත දර්ශකයන් කොළඹ වරායට හිමිවනුයේ 23 වන ස්ථානයයි.

මෙම ජයග්‍රහණය කොළඹ වරාය විසින් ජාත්‍යන්තර වෙළෙඳ නාවික ඉතිහාසයේ ප්‍රථම වතාවට තබන ලද සුවිශේෂි ඉදිරි පියවර වන අතර, මේ හේතුවෙන් ආසියාව, මැදපෙරදිග හා යුරෝපයේ සියලු වරායන් අභිබවා යාමට කොළඹ වරායට හැකිවිය.

එමෙන්ම, 2018 වර්ෂයේ දී කොළඹ වරාය ලොව **හොඳම සහසම්බන්ධිත** (Connectivity) වරායයන් අතර 11 වන ස්ථානයට පත්විය. එය ද සුවිශේෂි ජයග්‍රහණය කී. මෙම ජයග්‍රහණයන් ලඟා කර ගන්නා අතරම, කොළඹ වරාය තුළ සියළු මෙහෙයුම් සඳහා වන ධාරිතාවන් පුළුල් කිරීමටත් අවශ්‍ය ඉදිරි සැළසුම් වෙනුවෙන් වන තීරණ වලට එළඹෙමින් සිටින බව මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරමින් වරාය හා නාවික, දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මහතා පැවසීය. එමෙන්ම, ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ එම තත්ත්වය සහතික වන්නේ කොළඹ වරායේ වර්ධනයේ ස්ථාවරත්වය අනුව බවයි. එමෙන්ම, මෙම අවස්ථාවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යොමුව සිටින්නේ කොළඹ වරාය පුළුල් කිරීමේ කටයුතු යුහුසුලුව සිදු කිරීමට බව ද පැවසී ය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2019 වර්ෂයේ දී පවත්වන ලද ගෝලීය වරාය සංසදයේ දී (Globle Port Forum - GPF) පිට පිටම දෙවන වතාවටත් "**වර්ෂයේ වරාය අධිකාරිය - 2019**" සම්මානයට පාත්‍ර විය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙම ජයග්‍රහණය සඳහා කළමණාකාරීත්වය, සේවක මහත්ම මහත්මීන්, ගණුදෙනුකරුවන් සහ සැම දෙනෙකු-ගේම සහයෝගීතාවය ලැබුණි.

# ජර්මානු ප්‍රවාහන හා සැපයුම් වෙළඳ ප්‍රදර්ශනයට කොළඹ වරායත්






ජර්මනිය විසින් වාර්ෂිකව සංවිධානය කරන ප්‍රවාහන හා සේවා සැපයුම් වෙළෙඳපොළ ප්‍රදර්ශනය මෙවරද ජූනි 04 දා සිට 07 වන දා දක්වා මියුනිච් හිදී පැවැත්විණි. මෙහි ශ්‍රී ලංකාවට ද මණ්ඩපයක් වෙන්ව තිබුණි. කොළඹ වරාය නියෝජනය කරමින් ජයබහළු පර්යන්තය (JCT) සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) කළම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල් (CICT) විශේෂිත නියෝජිත පිරිසක් සහභාගි වූහ. මෙහිදී කොළඹ වරායේ වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සිදු කළේ මෙම විශේෂිත නියෝජිත පිරිස විසිනි.

මෙම වෙළෙඳපළ සඳහා වාර්ෂිකව ප්‍රදර්ශකයින් 2000 ක් පමණ සහභාගි වූ අතර 70000 ක පමණ ව්‍යාපාරික පිරිසක් ප්‍රවාහන, සේවා සැපයුම්, සැපයුම් ක්‍රම, තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර වලින් නැරඹීමට එක්වූහ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සම්බන්ධීකාරිත්වය දැරීය. 2018 ජූලි 19 වන දින එළිදක්වන ලද ජාතික අපනයන උපායමාර්ගික පරමාර්ථයන්ට අනුව ශ්‍රී ලංකාව සේවා සැපයුම් කේන්ද්‍රයක් කිරීමේ අරමුණ පෙරදැරිව මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ ආයතන සහභාගි කරවීමට කටයුතු කෙරුණි.

2019 - ප්‍රවාහන හා සේවා සැපයුම් ප්‍රදර්ශනය ශ්‍රී ලංකා මණ්ඩපය විවෘත කිරීමේ අවස්ථාවට වරාය හා නාවික සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මහතා මෙන්ම ජර්මනියේ පාර්ලිමේන්තු රාජ්‍ය ලේකම් ස්ටෙෆන් බිල්ගර් (Mr. Steffen Bilger) මහතා ද සහභාගි විය.

මෙම අවස්ථාවේ සිය අදහස් දක්වමින් ගරු අමාත්‍ය සාගල රත්නායක මහතා ප්‍රකාශ කර සිටියේ "ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම සහ සම්බන්ධිත වරාය අතර 11 වන ස්ථානයටත් ලොව හොඳම බහලු මෙහෙයුම් වරාය අතර 22 වන ස්ථානයටත් පත්ව තිබීම ශ්‍රී ලංකාවේ වරාය ප්‍රවර්ධනය සඳහා මහඟු අවස්ථාවක් උදාකර දී ඇති බවයි. එමෙන්ම, ගරු අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකාවේ වරාය සංවර්ධනය පිළිබඳව හා එහි ප්‍රගතිය පිළිබඳව පර්මනියේ පාර්ලිමේන්තු රාජ්‍ය ලේකම් ස්ටෙෆන් බිල්ගර් මහතාට පැහැදිලි කළේය.

මෙම අවස්ථාවේ අදහස් දක්වමින් ස්ටෙෆන් බිල්ගර් මහතා ගරු අමාත්‍යතුමා වෙත ස්තූති කළේ ය. එමෙන්ම මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාව විසින් විශේෂ නියෝජිත පිරිසක් සහභාගි කරවීම තුළින් බොහෝ ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට ලඟාකරගත හැකි බවත් ඒ මහතා අවධාරණය කළේ ය.

2019 - ජර්මන් - මියුනිච් ප්‍රවාහන හා සේවා සැපයුම් ප්‍රදර්ශනය සඳහා කොළඹ වරාය නියෝජනය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය අධ්‍යක්ෂ (සේවා සැපයුම්) - උපුල් ජයතිස්ස, ප්‍රධාන කළමණාකරු (සන්නිවේදන හා මහජන සම්බන්ධතා) -නලින් අපොන්සු මහත්වරුන්ද SAGT පර්යන්තය නියෝජනය කරමින් එහි ප්‍රධාන විධායක නිලධාරී - රොමේෂ් ඩේවිඩ්, ප්‍රධාන වාණිජ නිලධාරී - ටෙඩ් මුත්තයියා, වාණිජ හා වෙළෙඳ ප්‍රවර්ධන කළමණාකරු - දස්මා කරුණාරත්න යන මහත්ම මහත්මීන්ද, CICT පර්යන්තය නියෝජනය කරමින් එහි සාමාන්‍යාධිකාරි (වාණිජ හා වෙළෙඳ ප්‍රවර්ධන) කැට්‍රියෝනා ජයසුන්දර මහත්මිය ද සහභාගි වූහ.

# මොන ම තත්ත්වය යටතේවත් නැගෙනහිර පර්යන්තයේ පාලනය පිට ට යන්නේ නැහැ

## කාවන් රත්නායක

**සභාපති - ශ්‍රී ලංකා වරාය අධිකාරිය**



කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි සිසුවෙකු වන ඔහු, කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා උපාධිධාරියෙකි.

ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය නගා සිටුවීම උදෙසා ජාතික සංචාරක සැලසුම් ක්‍රියාවට නංවමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති ධූරය හෙබවූ හෙතෙම ලේක්හවුස් ආයතනයේ සභාපතිධූරය මෙන් ම අයි.බී.එම්, ඩයලොග් ඇතුළු ආයතන රැසක ප්‍රධාන තනතුරු හොබවා තිබේ.

වරාය ක්ෂේත්‍රය රටට සහ හෙටට ගැලපෙන ප්‍රතිපත්ති රාමුවක පිහිටා කටයුතු කරමින් එතුමා අද දවසේ ජාතියට ජීවය දෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ධූරය හොබවන්නේ ය. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අත්දැකීම් සපිරි කාවන් රත්නායක නම් වූ සොඳුරු ආඥාදායකයා තීර්ථ සංලාපයට එක්වූයේ මේ ලෙසින්.

**රටේ පවතින වත්මන් තත්ත්වය සැලකිල්ලට ගෙන වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර සම්බන්ධයෙන් ඔබ තෘප්තිමත් වෙනවද?**

පසුගිය පාස්කු ඉරිදා එල්ල වුණු ත්‍රස්ත ප්‍රහාරයත් එක්ක කොළඹ වරාය පරිශ්‍රයේ ආරක්ෂාව තහවුරු කරන්න අපි පියවර රැසක් ගත්තා. නමුත් මේ ත්‍රස්ත ප්‍රහාරය එල්ල වෙන්නත් කලින් ඉඳලා වරාය පරිශ්‍රයේ ආරක්ෂක යාන්ත්‍රණය විධිමත් කිරීම සඳහා අපි කටයුතු කරමිනුයි සිටියේ. විශේෂයෙන්ම වරාය හරහා දිනපතා යන එන වාහන සම්බන්ධයෙන් අපි වඩාත් පරීක්ෂාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළා. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පස්සෙ අපි ආරක්ෂක අංශත් සමග සම්බන්ධ වෙලා ඉතා විධිමත් ආරක්ෂක සැලැසුමක් දියත් කළා. මේ හේතුව නිසා අපට මේ දක්වා හැකියාව ලැබිලා තියනවා වරාය තුළ කිසිදු කඩාකප්පල්කාරී ක්‍රියාවක් සිදු නොවී අපේ මෙහෙයුම් උපරිම කාර්යක්ෂමතාවෙන් යුතුව කරගෙන යන්න.. ඒ වගේම මම කියන්න ඕනැ අප මේ දක්වා සාර්ථක වෙලා තියන නිසා අපට මෙතැනින් එහාට අත් දෙක බැඳගෙන බලාගෙන ඉන්න බෑ. දිගින් දිගටම මේ කටයුත්ත එකම විදියේ අවධානයකින්, උනන්දුවකින් සිදු කරන්න ඕනැ

**කොළඹ වරායේ නැගෙනහිර පර්යන්ත ව්‍යාපෘතිය ඇතුළු කොළඹ වරායේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් විශාල කතාබහක් ඇති වෙලා තියනවා. ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක් ද?**

ශ්‍රී ලංකාව, ජපානය සහ ඉන්දියාව රජයන් අතර අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුමට අනුව නැගෙනහිර පර්යන්තයේ අයිතිය 100%ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතුයි. මේක ශ්‍රී ලංකාවට බෙහෙවින්ම වාසිදායක, ශ්‍රී ලංකාවේ ජාතික සම්පත් සුරක්ෂිත කෙරෙන අන්දමේ ගිවිසුමක්.

පසුගිය දා අත්සන් කෙරුණු ගිවිසුමෙන් සිද්ධ වෙන්නෙ කොළඹ වරාය නැගෙනහිර පර්‍යන්තය I සහ II කොටස් සංවර්ධනය කිරීම සඳහා ඉතාම සහනදායී පදනමක් යටතේ ජපානයෙන් ණය මුදලක් ලබා ගැනීම. ඒක ශ්‍රී ලංකාවට මෑත ඉතිහාසයේ ලැබුණු සහනදායීම ණය මුදල කිව්වොත් නිවැරදියි.

මේ ණය මුදලත් එක්ක නැගෙනහිර පර්‍යන්ත ව්‍යාපෘතිය පමාවක් නැතුව සම්පූර්ණ කරලා කොළඹ වරායට වැඩි ආදායමක් උපයාග න්න පුළුවන්. පර්යන්තයේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් පිහිටුවන සමාග මෙන් 51%ක අයිතිය තියෙන්නෙත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ. ඒ නිසා මොනම තත්ත්වයක් යටතේවත් නැගෙනහිර පර්යන්තයේ පාලනය පිටට යන්නේ නැහැ. ඒ නිසා මේ ගිවිසුමෙන් නැගෙනහිර පර්‍යන්තය විදෙස් රටකට පැවරෙනවා කියන කතාව අමූලික බොරුවක්.

**කොළඹ වරායේ නැගෙනහිර පර්යන්ත ව්‍යාපෘතිය නිසා වරාය රැකියාවන්ට සිදු වෙන්නේ මොන විදියේ බලපෑමක් ද?**

නැගෙනහිර පර්යන්ත ව්‍යාපෘතිය ගැන විතරක් කතා කළොත්, මෙයින් රැකියා වලට එල්ල වෙන විශාලම බලපෑම තමයි අලූත් රැකියා අවස්ථා 1000ක් පමණ අලූතින් නිර්මාණය වීම. මේ නිසා වරායේ මානව සම්පත තවත් ශක්තිමත් වෙනවා. ඇතැම් අය වැරදි මතයක ඉන්නවා මේ ව්‍යාපෘති නිසා රැකියා අවස්ථා අඩුවෙලා සේවකයන්ට ගෙදර යන්න වෙයි කියලා. නමුත් සිද්ධ වෙන්නේ ඒකෙ අනිත් පැත්ත. මේ ව්‍යාපෘති නිසා අපට වැඩි වැඩියෙන් දක්ෂ, කුසලතා සහිත සේවකයන් වුවමනා වෙනවා. ඒ වගේම බටහිර පර්යන්ත ව්‍යාපෘතියත් සම්පූර්ණ වුණාම එතැනත් තවත් රැකියා 1000ක් පමණ අලූතෙන් නිර්මාණය වෙනවා. කළමනාකරණය විදියට අපි හිතන්නේ අපට සිටින වටිනාම සම්පත මානව සම්පත කියලයි. ඒ මානව සම්පත දුර්වල කරන්න අපි කිසිවිටෙකත් කටයුතු කරන්නේ නැහැ.

> **"කළමනාකරණය විදියට අපි හිතන්නේ අපට සිටින වටිනාම සම්පත මානව සම්පත කියලයි. ඒ මානව සම්පත දුර්වල කරන්න අපි කිසිවිටෙකත් කටයුතු කරන්නේ නැහැ"**

**ජාතික වරාය මුලික සැලසුමේ වත්මන් තත්ත්වය කුමක් ද?**

ජාතික වරාය මූලික සැලසුමෙන් 2050 වසර වෙනකල් ලංකාවේ වරාය ක්ෂේත්‍රය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සහ ක්‍රමෝපායන් ලබා දෙනවා. මේක ඉතාම වැදගත් ලියැවිල්ලක්. ආසියානු සංවර්ධන බැංකුවේ ද සහය ඇතිව සකස් කෙරුණු මේ ලියැවිල්ල වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ද අනුමත කොට තිබෙනවා. ඒ අනුවයි එහි අඩංගු සැලසුම් අපි ක්‍රියාවට නංවන්නේ. විශේෂයෙන්ම නැගෙනහිර පර්යන්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි ඉදිරියට ගියෙත් මේ ජාතික වරාය මූලික සැලසුමේ නිර්දේශ වලට අනුවයි. මම විශ්වාස කරනවා ජාතික වරාය මූලික සැලසුම වරාය අධිකාරියේ සෑම සේවකයෙකු විසින්ම කියැවිය යුතු ලියැවිල්ලක් කියලා. ඔවුන්ගේ පහසුව සඳහා ඉදිරියේ දී මෙය සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කරන්නත් ක්‍රියා කරගෙන යනවා.

**කොළඹ වරායේ අනාගතය සඳහා පිරිසුදු, හරිත සහ සුහුරු වරාය වගේ නූතන සංකල්ප උපකාරී වෙන්නේ මොන විදියට ද?**

වරායක් කාර්යක්ෂම වෙන්න වගේම ලෝකයේ ආකර්ශණය වරාය දිනා ගන්නත් පිරිසිදු සහ හරිත වරාය කියන සංකල්ප ඉතාම වැදගත් වෙනවා. හුදෙක් සංඛ්‍යාත්මක අගයන් ඉහළ දැමීමෙන් පමණක් අද ලෝකයේ වරායක් ඉහළට ඔසවා තබන්න බැහැ. මේ නිසා තමයි කොළඹ වරායට පිරිසිදු වරාය, හරිත වරාය විතරක් නෙවෙයි, සුහුරු වරාය කියන සංකල්ප හඳුන්වා දෙන්න කටයුතු කරලා තියෙන්නේ. මෙතැනදි කළමනාකාරීත්වයේ මැදිහත්වීම වගේම සේවකයන්ගේ කැපවීමත් අත්‍යවශ්‍ය වෙනවා.

විශේෂයෙන්ම වරාය පිරිසිදු වරායක් ලෙස පවත්වා ගැනීමේ ක්‍රියාවලියේ දී මේ ආයතනයේ සේවය කරන සෑම මට්ටමකම සේවකයන්ට ඒ සඳහා විශාල කාර්යභාරයක් කරන්න තියෙනවා. එම නිසා මම විශ්වාස කරන්නේ ඉහළ සිට පහළට ඒ ආකල්පය ගොඩනැගෙන්න ඕනෑ කියලයි. මේ කාරණය ගැන මම නිතරම වරාය අධිකාරියේ ඉහළ කළමනාකාඅරීත්වය එක්කත් සාකච්ඡා කරලා තියනවා. ඔවුන්ගෙනුත් මේ සඳහා විශාල සහයෝගයක් ලැබෙනවා.

07 පිටුවට >>

# නිකසල සුපිරිසිදු වරායක් උදෙසා...



සටහන
උපාලි ද සොයිසා
(අතිරේක කළමණාකාර අධ්‍යක්‍ෂ)

නිකසල වරායක සොඳුරු අභිමානය ඔබ වෙත තිළිණ කිරීමේ අදිටනින් වරාය පරිශ්‍රය කැලි කසලින් තොර සොඳුරු වරායයක් බවට පත් කිරීමට සභාපතිතුමා විසින් අවධාරණය කර තිබේ. ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම පසුගිය දා කළමණාකාරීත්වය විසින් සිදු කරන ලදී. එහි දී විෂය ක්‍ෂේත්‍ර රැසක් ඔස්සේ මේ පිළිබඳ සාකච්ඡා කිරීම සිදු වි ය.

සමස්ථ වරාය තුළ එදිනෙදා එකතුවන කසල හා අනෙකුත් අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ මෙහි දී අදහස් දැක්වූ ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) එම්.එස්.එස්. දේවප්‍රිය මහතා පවසා සිටියේ මෙම කටයුත්ත සඳහා සෑම කොට්ඨාශයකම සේවය කරන සියළුම සේවක මහත්ම මහත්මීන් ගේ දායකත්වය ලබා දිය යුතු බවයි. තව ද මහජන සෞඛ්‍ය පරික්‍ෂක අංශයට ප්‍රමාණවත් උපාංග නොමැති වීම, කසල වර්ගීකරණය සඳහා පූර්ණ දායකත්වය නොලැබීම, වීදුරු කැබලි වැනි දෑ කසල ලෙස අපහරණය කළ නොහැකි වීම ඇතුළු ගැටළු පිළිබඳව ද මෙහි දී අවධානයට පාත්‍ර වි ය.

මේ සඳහා මහජන සෞඛ්‍ය පරික්‍ෂක අංශයට ප්‍රමාණවත් සේවක මහතුන් මානව සම්පත් කළමණාකාරතුමා මාර්ග යෙන් ලබා ගැනීමට පියවර ගැනීම, දැනට අලුත්වැඩියාවට දමා ඇති කසල අපහරණය සඳහා භාවිත කරන වාහන අලුත්වැඩියා කටයුතු කඩිනම් කිරීම, කසල වර්ගීකරණය සඳහා සියළුම සේවක මහත්ම මහත්මීන්ගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම තුළින් නිකසල වරාය සංකල්පය යතාර්ථයක් බවට පත් කිරීමට අවකාශය සලසා ගත හැක. සෑම කොට්ඨාශයකටම බාධාවක් වී ඇති වීදුරු කැබලි එක් ස්ථානයකට ගොඩ ගසා පෞද්ගලික අංශයට විකිණීම හෝ අපහරණය කිරීමට කටයුතු කිරීම ද මෙම සාකච්ඡාවේ දී ගත් ප්‍රායෝගික විසඳුමකි.

වාර්ෂික සමීක්‍ෂණයෙන් අනතුරුව පාවිච්චියෙන් පසු ඉවත් කරන භාණ්ඩ විනාශ කිරීම නිසියාකාරව සිදු නොවීම ද මෙම කසල ගැටලුව උත්සන්න වීමට බලපාන්නකි. එක් එක් කොට්ඨාශ වල වාර්ෂික සමීක්‍ෂණයෙන් අනතුරුව භාවිතයෙන් ඉවත ලන භාණ්ඩ විනාශ කළ යුතු වුව ද ඒවා අදාල කොට්ඨාශ තුළ ගොඩ ගසා තිබීම බොහෝ කොට්ඨාශයන් හි දැකිය හැක. මේ නිසා ආයතන තුළ පවත්වා ගත යුතු විධිමත් භාවයට ද එය බරපතල ගැටලුවක් වී ඇත.

මේ සඳහා සියලු කොට්ඨාශයන් විනාශ කළ යුතු, භාවිතයෙන් ඉවත් කළ යුතු සියලු භාණ්ඩ චෛත්‍ය පරිශ්‍රය පසුපසින් පිහිටි දකුණු කොළඹ වරායට පිවිසෙන මාර්ගය අවට භූමියෙන් තෝරාගත් භූමි භාගයක ගොඩ ගසා පෞද්ගලික අංශයේ විනාශකරුවන්ගේ සේවය ලබාගෙන විනාශ කිරීමට ඉදිරියේ දී පියවර ගනු ඇත.

වරාය යනු ජාත්‍යන්තරය හා බැඳුණු නිරන්තරයෙන් කීර්තිය පවත්වාගත යුතු ආයතනයකි. එහි දී එහි පවිත්‍රතාවය හා මග දෙපස අලංකරණය හා ක්‍රමවත් භාවය නිරන්තරයෙන් පවත්වාගත යුතු ප්‍රමිති තත්ත්වයකි. නමුත් වරාය අවට ප්‍රධාන පාර දෙපස අක්‍රමවත්ව ගොඩ ගසා ඇති සුන් බුන් හා අබලි ද්‍රව්‍ය මෙම ක්‍රමවත් භාවයට මහත් හිරිහැරයකි. එබැවින් එවැනි දෑ හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට පියවර ගැනීමට ද කටයුතු සැලසෙනු ඇත.

සියලුම කොට්ඨාශ වල භාවිතයෙන් ඉවත ලන පරිගණක හා අනෙකුත් පරිගණක උපාංග කොට්ඨාශ තුළ ගොඩ ගැසී තිබීම හා එම උපාංග අපහරණය ක්‍රමවත්ව සිදු නොවීම ද නිකසල වරායයක් ගොඩ නැගීමට ප්‍රතිරෝධකයකි. මේ සඳහා සියලුම කොට්ඨාශ ප්‍රධාන නිළධාරි මහත්වරුන් හා අධ්‍යක්‍ෂ (තොරතුරු පද්ධති) සුහදතාවයෙන් යුතුව එවැනි පරිගණක හා පරිගණක උපාංග විනාශ කිරීම සඳහා තොරතුරු පද්ධති කොට්ඨාශයට භාර දිය යුතු අතර, ඒවා වත්කම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා කළමණාකාර අධ්‍යක්‍ෂකගෙන් අනුමැතිය ලබා මුදල් කොට්ඨාශය වෙත යොමු කළ යුතු වේ. අනතුරුව අධ්‍යක්‍ෂ (තොරතුරු පද්ධති) විසින් එවැනි පරිගණක පිළිගත් ගර්හිත පරිගණක අපහරණය කරනු ලබන පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුගේ සේවාව ලබා ගැනීම සඳහා පියවර ගැනේ.

ආපන ශාලා සහ අවට පරිසරය අපිරිසිදු හා අවිධිමත් ව පවතින බවට වාර්තා වීම ද සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. කොළඹ වරාය තුළ සේවක මහත්ම මහත්මීන් හා ගනුදෙනුකරුවන් සඳහා ආපන ශාලා 13ක් පවතින අතර, මේවායේ පවිත්‍රතාවය හා අවට පරිසරය ඉතා යහපත් මට්ටමක් කරා රැගෙන යාමට ප්‍රධාන කළමණාකරු (සු. හා කා.ස.) සුභ සාධන පරිපාලක මහත්ම මහත්මීන් විසින් නිරන්තරයෙන් ආපන ශාලා පරික්‍ෂාවට ලක් කර අදාල ඉංජිනේරු කොට්ඨාශ වල සහයෝගයෙන් අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කර එකී ගැටළු මුලිනුපුටා දැමීමට පියවර ගනු ඇත.

මෙම කටයුත්තේ දී සේවක ඔබ වෙත ද විශාල වගකීමක් පැවරෙනු ඇත. කාර්යාලීය පරිශ්‍රය හා කාර්යාල පරිසරය අපවිත්‍ර කිරීමට නොව පවිත්‍ර කිරීමට නිරන්තරයෙන් ඇප කැප වීම ඉතා වැදගත් ය. වර්ගීකරණයට ලක් කර ඇති කසල බඳුන් වලට නිසි පරිදි පොලිතින්, දිරාපත් වන අපද්‍රව්‍ය, කඩදාසි වශයෙන් වෙන් කර අපද්‍රව්‍ය බැහැර කිරීමට නිරන්තරයෙන් කටයුතු කළ යුතු ම ය.

### වරාය ජාතික සේවක සංගමයේ සභාපති

# උදේනි කළුතන්ත්‍රී මහතා

### වරාය අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික ධූරයකට



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජාතික සේවක සංගමයේ සභාපති උදේනි කළුතන්ත්‍රී මහතා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙකු ලෙස පත් වි ය.

වරාය, නාවික හා දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමා විසින් උදේනි කළුතන්ත්‍රී මහතා වෙත අදාල පත්වීම් ලිපිය ලබා දුන් අතර, එම අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති කාවන් රත්නායක, කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් අතුල හේවාවිතාරණ මහතා ඇතුළු කළමණාකාරීත්වයේ උසස් නිළධාරීන් සහ ජාතික සේවක සංගමයේ නිළධාරීන් ඇතුළු පිරිසක් එක් වූහ.

## මොන ම තත්ත්වය යටතේවත්

05 පිටුවෙන්

**ගාලු, තිකුණාමල සහ කන්කසන්තුරේ වරායන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය කොහොමද?**

ජාතික වරාය සංවර්ධන මූලික සැලසුමට අනුව ඒ කටයුතු සිදු වෙනවා. ගාලු වරාය දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනාගන්නා සංචාරක වරායක් ලෙස දියුණු කිරීමට පියවර ගෙන තිබෙන අතරම, කන්කසන්තුරේ වරාය ඉන්දීය රජයේද සහය ඇතිව වාණිජ වරායක් ලෙස දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමට මේ වන විට අත්සන් තබා තිබෙනවා. ඒ වගේම ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතවත් සංවර්ධන සැලසුමක් ක්‍රියාවට නංවා තිබෙනවා. ඒ වගේම කියන්න අවශ්‍යයි ගාලු සහ ත්‍රිකුණාමල වරායට රාත්‍රී මෙහෙයුම් හඳුන්වා දීම සඳහාත් අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතිනවා. මේ යටතේ ගාලු සහ ත්‍රිකුණාමල වරායන් පැය 24 පුරාම මෙහෙයුම් සිදු කළ හැකි වරායක් බවට පත්වෙනවා.

# අග්‍රහාර ප්‍රතිපූර්ණයේ ගැටළු විසඳේ

අග්‍රහාර ක්‍රමය යටතේ පෞද්ගලික රෝහලක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන අවස්ථාවක මුදල් තමන් විසින් ගෙවා බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් කිරීමේ දී එම බිල්පතේ ඇතුලත්වීමේ ගාස්තු (Admission Fees) වශයෙන් රෝහල විසින් අයකරන මුදල ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ප්‍රතිපූර්ණය නොකරන බැවින් සේවකයින් අපසුතාවයට මුහුණ පා ඇත. මේ සම්බන්ධව ජාතික රක්ෂණ භාර අරමුදල සමග සාකච්ඡා කරන ලදී. ඒ අනුව පහත සඳහන් රෝහල් ඇතුලත්වීමේ ගාස්තු (Admission Fees) අය නොකරන බව දන්වා ඇත.

1. නවලෝක රෝහල
2. ආසිරි මෙඩිකල් රෝහල
3. ආසිරි සෙන්ට්‍රල් රෝහල
4. ආසිරි සර්ජිකල් රෝහල
5. හේමාස් රෝහල

මෙයට අමතරව සේවක මහත්ම මහත්මීන් හා ඔවුන්ගේ පවුලේ යැපෙන්නන් මෙම රෝහල්වලදී සිදු කරන ලබන වෛද්‍ය පරීක්ෂණ සඳහා උපරිම 10% ක වට්ටමක් ද ලබා ගැනීමට හැකියාව ඇත. ඒ සෑම අවස්ථාවදීම වරාය අධිකාරිය විසින් නිකුත් කර ඇති ඡායාරූප බලපත්‍රය ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කිරීම අනිවාර්ය වේ.







### ලෝකය ජයගත්

# කොළඹ නැව්තටාකාංගනය

නැව් නිෂ්පාදනය සහ නැව් අළුත්වැඩියාව අතරින් ලංකාව හා ලෝකය ජයගත් කොළඹ නැව්තටාකාංගනය තවත් පියවරක් ඉදිරියට තබමින් ගැඹුරු මුහුදේ නැව් අලුත්වැඩියා කටයුත්තට මුල පිරීමක් පසුගිය දා ආරම්භ කරන ලදී.

එහි කටයුතු මරීනෝ Beach Hotel සංකීර්ණයෙදී අති උත්කර්ෂවයත් අයුරින් සහ අති විශාල නාවික ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

කොළඹ නැව්තටාකාංගනයේ උප සමාගමක් වශයෙන් ආරම්භ කෙරුණු "ඩොක්යාඩ් ටෙක්නිකල් සර්විස්" (DTS) අංශය යටතේ පුහුණු කෙරුණු දක්ෂ පළපුරුදු සේවක පිරිසක් දවසේ පැය 24 සහ සතියේ දින 07 ම සේවයේ යෙදීමට කටයුතු කරන අතර දිවයිනේ ඕනෑම නාවික ප්‍රදේශයක සේවය කිරීමට මොවුන්ගේ බලාපොරොත්තුවයි.

මගී ප්‍රවාහන නෞකා සහ මුහුදේ කේබල් අතුරන නාවික යාත්‍රා නිශ්පාදනය කරන ලෝකය ජයගත් කොළඹ නැව්තටාකාංගනය තවත් ජයග්‍රාහී ඉදිරි කටයුත්තක් ලෙස මෙය හැදින්විය හැක. කොළඹ නැව් තටාකාංගන ආයතනය 1993 සිට ජපානයේ ඔනිමිචි නැව් තටාකාංගන ආයතනය සමග සහයෝගයෙන් කටයුතු කරමින් ඉහළ ගුණාත්වයකින් යුතු නැව් තැනීම්, සහ නැව් අලූත්වැඩියා කටයුතුවල නිරත වෙමින් සිටී.

## වරාය අධිකාරිය සඳහා නියමු යාත්‍රා 2 ක් නිෂ්පාදනයට කොළඹ නැව් තටාකාංගනය එක්වේ

යාත්‍රා නිෂ්පාදනය තුළ කීර්තිමත් නාමයක් හිමිකරගත් කොළඹ නැව් තටාකාංගන (Colombo Dockyard) සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා මීටර් 19 ක දිගින් යුත් නියමු යාත්‍රා 2 ක් නිෂ්පාදනයට කටයුතු කරයි. එහි සමාරම්භක උත්සව අවස්ථාව වරාය හා නාවික, දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එම පරිශ්‍රයේ දී අද දින (2019.06.11) පැවැත්විණි.

එහිදී උත්සව සභාව ඇමතු වරාය හා නාවික, දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍ය සාගල රත්නායක මහතා, "මෙම අවස්ථාව සුවිශේෂි බවත්, සමුද්‍රීය කලාපයේ කීර්තිමත් නාමයක් හිමිකරගත් කොළඹ නැව් තටාකාංගන සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා මීටර් 19 ක දිගින් යුත් නියමු යාත්‍රා 2 ක් නිෂ්පාදනය කිරීම මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට ද ලබා දෙන අනගි දායකත්වයක් බැව් පැවසීය. පසුගිය යුධ සමය තුළ නාවික ක්ෂේත්‍රයට අවශ්‍ය යුධ යාත්‍රා නිෂ්පාදනයට ද දායකත්වය සැපයීම තුළින් මේ රටේ ආරක්ෂාව උදෙසා ද දායකත්වය ලබා දෙමින් අගනා මෙහෙවරක් කළ බැව් පැවසීය."



# සුහුරු ලෝකයක ස්මාර්ට්ව ජීවත් වෙන්න

අසංක උදිත රාජපක්ෂ

දිනෙන් දින දියුණු වන තාක්ෂණික ලෝකය අප ජීවත් වන්නෙමු. දෛනික ජීවන කටයුතු සපුරා ගැනීමේ දී නොයෙකුත් උපාංග අපගේ සහායට වර්තමානයේ දී භාවිතයට ගන්නට අප හුරුවී සිටින්නෙමු. මේ උපාංග අතර ''සුහුරු'' හෙවත් 'Smart' ය උපාංග වත්මනේ දී අපගේ සාමාන්‍ය ජීවිතයේ හොඳම ''සහකරු හෝ සහකාරිය'' ලෙස පෙම්බැද ළඟින්ම තබා ගැනීමට අප උත්සුකවී ඇත්තෙ මු.

Smart යන සංකල්පය සෑදි ඇත්තේ වචන හතකිනි. 'Self, Monitoring, Analysis, Reporting, Technology යන වචන කෙටිකර දක්වීමක් ලෙස අප ''ස්මාට්' ලෙස හඳුන්වයි. වෙනත් කෙනෙකුගේ ආධාරයක් නොමැතිව යම් කාර්යයක් තාක්ෂණිකව සැකසීමට පත්වීම ලෙස මෙය සිංහලෙන් අර්ථ දක්විය හැක. අද වන විට මේ සුහුරු හෙවත් ස්මාට් උපකරණ වලින් ලොව වැඩිපුරම ජනප්‍රිය හා වැඩි දෙනෙක් අතර පවතින උපාංගය වන්නේ ජංගම දුරකතනයයි. මීට දශක දෙකකට පෙර සාමාන්‍ය දුරකථන ඇමතුමක් හෝ කෙටි පණිවිඩයක් යැවීමට පමණක් සමත්කම් දක්වූ මෙම උපකරණය පසුගිය වසර 8 ක පමණ කාලයකදී අන්තර්ජාලය, කැමරාකරණය, චන්ද්‍රිකා තාක්ෂණය මගින් සිතියම් කියවීම, සංගීතය ආදි විවිධ වූ කාර්යයන්ගෙන් සන්නද්ධව සුහුරු උපකරණ හෙවත් '' Smart Phone'' බවට පරිවර්තනය විය. මීට අමතරව, රථවාහන, පරිගණක, රූපවාහිනී යන්ත්‍රය, අතේ බදින ඔරලෝසුව, ශීතකරණය, වායුසමීකරණ යන්ත්‍රයේ සිට විදුලි බල්බය දක්වාම සුහුරු තාක්ෂණය සාමාන්‍යකරණය වී අවසන් ය. මෙලෙස සාමාන්‍යකරණය වූ සුහුරු තාක්ෂණය වත්මන අප ඵලදායි ලෙස භාවිතයට ගන්නවා ද යන්න සොයා බැලීය යුතු කරුණක් වේ. මක්නිසාද යත් අදාල උපාංග සුහුරු වූවත් අපගේ ක්‍රියාවන් ස්මාර්ට් නොවුනහොත් එම තාක්ෂණයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීම අපට නොලැබී යනු ඇත.

ඔබ දිනපතා භාවිතකරන ජංගම දුරකථනයේ සාමාජ ජාල මාධ්‍ය පරිහරණයට අමතරව ඔබගේ එදිනෙදා කාර්යයන් රාශියක් අද වන විට ස්මාර්ට් ලෙස සිදුකර ගැනීමට අවකාශ සලසා තිබේ. ඉන් ප්‍රධාන වන්නේ ගෙවීම් කටයුතු කිරීමයි. අද වන විට සියලුම බැංකු තම ගණුදෙනුකරුවන්ට පරිගණකයක් භාවිතා කර හෝ ජංගම දුරකථනයකින් ගනුදෙනු කිරීමේ පහසුකම නොමිලේ ලබා දී තිබේ. මේ හේතුව නිසා ඔබගේ කාලය විශාල ලෙස ඉතිරි වනු ඇත. උදාහරණයක් ලෙස වරායේ සේවකයෝ බහුතරයකගේ ගිණුම් පවතින මහජන බැංකුවේ Online බැංකු පහසුකම ලබාගතහොත් එම පහසුකම හරහා ඔබේ දුරකථන බිල්පත්, විදුලි බිල්පත්, ජල බිල්පත් ඇතුළු මාසිකව සිදුකරන ගෙවීම් සියල්ලක්ම පාහේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයෙන් සිදු කල හැකි වනවා පමණක් නොව එම ගෙවීම් මාසිකව නිශ්චිත මුදලක් ලෙස ගෙවී යන පරිදි අදාල උපදෙස් දුන්විට ඔබට අමතක වූවත් ස්වයංක්‍රීයව එම ගෙවීම් අදාල දිනයන්ට ගෙවීමේ පහසුකම් සලසා තිබේ. මේ පහසුකම් සියලු මූල්‍ය ආයතන තම සේවාදායකයන්ට ලබාදී ඇත. එය දිරිමත් කිරීමට විවිධ අවස්ථාවලදි යම් වරප්‍රසාද ලබාදීම් ද සිදු කරයි. මෙලෙස සුහුරු ක්‍රමයට බැංකු ගනුදෙනු සිදුකිරීමෙන් රටේ කාර්යක්ෂමතාවය ඉහල යන අතරම මුදල් සොරකම් කිරීම මෙන්ම ගෙවීම් ක්‍රියාවලියේ භාවිතා වන කඩදාසි භාවිතාව, ඒ සඳහා අදාල ආයතනයන්ට බලශක්ති පිරිවැය අඩුවීම් තුළින් වක්‍රාකාරව පරිසරයට වන හානිය ද අවම වීම මේ තුළ පවතින සෙසු සාධනීය තත්ත්වයන් ය.

> වරායේ සේවකයෝ බහුතරයකගේ ගිණුම් පවතින මහජන බැංකුවේ Online බැංකු පහසුකම ලබාගතහොත් එම පහසුකම හරහා ඔබේ දුරකථන බිල්පත්, විදුලි බිල්පත්, ජල බිල්පත් ඇතුළු මාසිකව සිදුකරන ගෙවීම් සියල්ලක්ම පාහේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයෙන් සිදු කල හැකි වනවා පමණක් නොව එම ගෙවීම් මාසිකව නිශ්චිත මුදලක් ලෙස ගෙවී යන පරිදි අදාල උපදෙස් දුන්විට ඔබට අමතක වූවත් ස්වයංක්‍රීයව එම ගෙවීම් අදාල දිනයන්ට ගෙවීමේ පහසුකම් සලසා තිබේ.

මීට අමතරව සමාජ මාධ්‍යයේ ද අප නොදන්නා විෂයන් පිළිබඳව හැදෑරීමට මෙම තාක්ෂණය යොදා නිමවූ මෘදුකාංග ගණනාවක්ම තිබේ. එසේම ඔබ කැමති පොත් කියවීමට, e-පුස්තකාල, e-Book (විද්‍යුත් පොත්) ඕනෑතරම් ස්ථාපිත කර තිබේ. විශේෂයෙන්ම මේ වන විට සිංහල හා දමිල මාධ්‍යයේ අදාල විෂයන් පිළිබඳව තොරතුරු පලවීමේ විශාල වර්ධනයක් ද දැකිය හැක. ජංගම දුරකථනයේ APPs ලෙස මෙලෙස e-පුස්තකාල පහසුකම් ඇති අතර ඔබට අදාල පොත් කියවීම දුරකථනය මගින් වර්තමානයේ සිදුකළ හැකි වීම විශේෂ වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකි ය.

ඊට අමතරව Youtube වෙබ් අඩවිය මගින් ඕනෑම නොදන්නා විෂයක් හෝ කාර්යයක් සිදුකරන ආකාරය සිංහල, ඉංග්‍රිසි මාධ්‍යයන්ගෙන් ඔබට නරඹා තේරුම් ගත හැකි ලෙස වීඩියෝ සකස් කර තිබීම මෙන්ම ඔබසතු හැකියාවක්, කාර්යයක් පිළිබඳව සයිබර් අවකාශයට එකතු කිරීමට හැකියාව ලැබීම අද දවසේ ඔබ ලබා ඇති සුහුරු ඵලයකි. ඒ තුළින් ඔබගේ වීඩියෝ නරඹන ප්‍රේක්ෂකයෝ ප්‍රමාණය මත ඔබට මුදල් ලබා ගැනීමේ හැකියාවක් ද පැවතීම තුළ එහි ගැබ්ව ඇති මූල්‍යමය වටිනාකම් හැඳින ගැනීමට ද ඔබවෙත අවකාශය සලසාලයි.

මෙම සුහුරු තාක්ෂණය උපයෝගී කරගෙන සිදුකරන ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය සේවාවක් වන්නේ ටැක්සි සේවාවයි. වර්තමානයේ අපේ දෛනික ජීවිතයට විශාල පහසුවක් එයින් ගෙන දී ඇත. එමගින් ඔබගේ ගමන් ප්‍රවේශය හා ඊට අදාල පිරිවැය පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගෙන ඔබේ ගමන පහසුවෙන් යාමට-ඒමට මේ තුළින් සැලසෙන වාසිය අතිමහත් ය.

එසේම කුඩා දරුවන් තනියම ගමන් ගන්නේනම් දුරකථන මගින් (GSP ආධාරයෙන්) ඔවුන්ව නිරීක්ෂණය කිරීමේ අවකාශය ද අද දවසේ සුහුරු දෙමාපියන්ට හිමිව ඇති විශේෂ වාසියකි.

වරාය අධිකාරිය ද තම මෙහෙයුම් හා අනෙකුත් කටයුතු වර්තමානය වන විට ස්වයංක්‍රිය පද්ධතිවලින් ක්‍රියාත්මක සුහුරු පද්ධතියක් මගින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. ඒ අනුව නුදුරු අනාගතයේ දීම Smart Port සංකල්පය යටතේ වරාය ගෙවීම් කටයුතු, මෙහෙයුම් කටයුතු හා පරිපාලන කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත. ලිඛිත ලේඛන වෙනුවට විද්‍යුත් ලිපි හා ඉලෙක්ට්‍රොනික් අත්සන් භාවිතාවෙන් ද කොට්ඨාශ අතර ජාලගත කරන ලද පරිගණක පද්ධතියක් මගින් ඉතා කෙටි කලකින් තම සේවා අවශ්‍යතා සපුරාගතහැකි වරායක් අපට උරුමවනු ඇත. ලිපි ලේඛන වරායේ එහා කොනේ සිට මෙහා කොනට යන කාලය ශ්‍රමය හා ප්‍රවාහන වියදම් ඉතිරිවනවා පමණක් නොව අදාල ලේඛණවල සුරක්ෂිතාවය ද ඉහළ මට්ටමකට මේ තුළින් පවත්වනු ඇත. කඩදාසි භාවිතාව අවම කිරීමෙන් Green Port අභිලාෂයන් ද ඉටුකර ගැනීමට අපට හැකියාව උදාවේ. සුහුරු තාක්ෂණය උපයෝගි කරගෙන ඔබත් සුහුරු පුද්ගලයෙකු වන්නට අදාල තාක්ෂණය හා ආකල්පමය වර්ධනය කර ගැනීමටත් තම එදිනෙදා කටයුතු සැමවිටම Smart තාක්ෂණය භාවිත කරමින් සිදුකිරීමටත් කටයුතු කිරීම හෙට දවස ඔබට ද රටට ද යහපත් ප්‍රතිඵල ම ගෙන එනු ඇත.

# ලෝකයේ කිසිම රටක සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් නවතින්නේ නැහැ

## නිමල් ජයතිස්ස

**ප්‍රධාන කළමණාකරු (සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම්)**

19

සාකච්ඡා සටහන
උපුල් ගුරුගේ

89 වසරේ කළමණාකාර අභ්‍යාසලාභියෙකු ලෙසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට සම්බන්ධ වන ඔහු සම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් ක්‍රියාවලිය තුළ ස්වකීය නාමය සුවිශේෂි තතත්වයට පත් කළේ අප්‍රතිහත ධෛර්‍යයත්, කැපවීමේත් ප්‍රතිඵලයක් වශයෙනි. අද දවසේ මෙහෙයුම් කොට්ඨාශයේ සම්ප්‍රදායික නැව්බඩු අංශයේ ප්‍රධාන කළමණාකරු ලෙසින් කටයුතු කරනා ඔහු මෙවර 'තීර්ථ' සංලාපයට අපි එකතු කර ගත්තා.

**වරායේ අපට සාම්ප්‍රදායක නැව්බඩු කියු සැනින් ඔබව සිහිපත් වෙනවා.**

ඔව්, එය මට සතුටක්, කළමණාකාර අභ්‍යාස ලාභියෙකු හැටියට අවුරුදු 2 ක කාලයක් සෑම කොට්ඨාශයකම පුහුණුව ලැබීමෙන් පස්සේ විජය කුමාර පාලමේ අධිකාරි මෙහෙයුම් විදියටයි වැඩ භාරගත්තේ. සාම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් කියන වචනය ගත්තම එහි නියම අරුත වන්නේ සාමාන්‍ය නැව්බඩු මෙහෙයුම් කියන එකයි. තොග කඩන හැටියටත් මෙය හඳුන්වනවා. ඒ කාලේ බණ්ඩාරනායක පාලම, නියමු පාලම, විජය කුමාර පාලම පමණක් නොවෙයි රැජිණ පාලම, පවා සම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් පාලම් ලෙසින් හැඳින්වුණා. නමුත්, අද වන විට 90% ක් පමණ භාණ්ඩයන් බහලුකරණයට ලක්වීම නිසා සීනි, පිටි, පරිප්පු, යකඩ දැව පවා බහලුවල ප්‍රවාහනය සිදුවෙනවා. මේ නිසා යම් ප්‍රමාණයක සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් අඩුවීමක් තිබෙනවා. නමුත් ලෝකයේ කිසිම රටක සම්ප්‍රදායික නැව්බඩු මෙහෙයුම් නවතින්නේ නැහැ. විශේෂයෙන් පොහොර වැනි දේවල් බහලු මාධ්‍යයෙන් ප්‍රවාහන සිදුවන්නේ නැහැ. ඒ නිසා කවදාවත් සම්ප්‍රදායික නැව් බඩු වෙළෙඳාම ලෝකයෙන් ගිලිහී යන්නේ නැහැ.

**කලක් ඔබ ත්‍රි'මලේ වරායේ නේවාසික කළමණාකරු ලෙසින් ද කටයුතු කළා. අපි ඒ මතකය අවදි කරමු.**

ඒ ලංකාවේ යුද්ධය පැවති කාල වකවානුව, මම අවුරුදු 3 ක් එහි සේවය කළා. ඒ වගේම කන්කසන්තුරේ වරායෙත් සේවකයෝ පුහුණු කටයුතු සඳහා යෙදෙව්වා. ඒ කාලයේ අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්තුමා මගිනුයි උතුරුට භාණ්ඩ ප්‍රවාහනය සිදුවුණේ. මේ සඳහා රටේ ජාතික ආදායමෙන් විශාල ප්‍රමාණයක් වැය කරන්නට සිදුවුණා. නමුත් භාණ්ඩ උතුරට යැව්වාම ලබාගත් කෙනෙක්, සැසඳුමක් තිබුණේ නැහැ. මං ඒ සඳහා වැඩපිළිවෙලක් සකස් කළා. නිසි ක්‍රමවේදයකට සැසඳුම් ක්‍රියාවලියකට සුදුසු අවකාශයක් සකස් කරන්න කටයුතු කළා. ඒ ක්‍රමය බොහෝම සාර්ථක වුණා.

ඇත්තටම 2006 යුද්ධය අති බිහිසුණු කාලයේ ත්‍රි'මලය වරාය නේවාසික කළමණාකරු ලෙසින් කටයුතු කිරීමේ දී ත්‍රාසය, භීතිය, කෙතරම් තිබුණත් රැකියාවේ කටයුතු උපරිමයෙන් කරමින් තෘප්තිමත්ව ජීවිතේට මුහුණ දුන්නා. විශේෂයෙන් චලෙයි පුදුමාතලන් වැනි ස්ථානවලට කුඩා යාත්‍රා මගින් අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය සිදු කළා.





**නෙදර්ලන්තයේ වරාය හා නාවික කටයුතු පිළිබඳ පශ්චාත් උපාධිය පිළිබඳවත් කතා කරමු**

එය වරාය ජීවිතය තුළ ලැබු විශිෂ්ඨ අවස්ථාවක් හැටියට මං සලකනවා. ජාත්‍යන්තර වරාය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා ගැනීම බොහෝම වැදගත්. ඉන් අනතුරුව කොළඹ වරාය ජයබහළු පර්යන්තය, බණ්ඩාරනායක පාලම මගේ සේවා ස්ථාන වුණා.

**ගුරුවරයෙක් නොවී වරායට පැමිණීම පිළිබඳ ඔබ තෘප්තිමත් ද?**

ඇත්තටම මං තෘප්තිමත්, අවුරුදු 35 ක වරාය ජීවිතයෙන් මං සමුගන්නේ බොහෝම තෘප්තිමත්ව. හීන්කෙන්ද මහා විද්‍යාලයෙන් වගේම දෙල්ගොඩ කළ්‍යාණ ප්‍රදීපයෙන් උසස් අධ්‍යාපනය හැදෑරු මං කැළණිය සරසවියට තේරෙනවා. එහි විශේෂවේදී උපාධිය හැදෑරීමෙන් පස්සේ මට ගුරුපත්වීමකට යන්නට අවස්ථාව ලැබෙනවා. ඒත් එක්කම වරායේ රැකියාවටත් අවස්ථාව ලැබෙනවා. බොහෝම දුරදිග බලා තීරණය කිරීමෙන් පස්සේ මං වරායේ රැකියාවට සම්බන්ධ වෙනවා. එදා ගත් තීරණය පිළිබඳ මං දහස්වාරයක් සංතෝස වෙනවා. මං තමයි එවකට හිටිය ලාබාලතම අධිකාරිවරයා. ඒ වගේම මාගේ පියාත් වරාය සේවකයෙක් ලෙස කටයුතු කළා. එතුමා විසිදාගමගේ ජෝකින්, බත්තල් අංශයේ වසර 40 ක් සේවය කර තිබෙනවා. මාගේ පියා ජීවතුන් අතරේ සිටියානම් අද මා ඉන්නා තැන ගැන බොහෝම ආඩම්බර වේවි.

**වරාය දන්සැල් සමිතිය හා ඔබ අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධතාවයක්**

ඔව්, වරායේ දන්සල් සමිතිය ආරම්භ කර තියෙන්නේ 1960 වර්ෂයේ. එතැන් පටන් එය අඛණ්ඩව පවත්වාගෙන එනවා. 1989 වසරේ සිට මමත් එයට දායකත්වය ලබා දුන්නා. මෙම දන්සලේ විශේෂත්වය තමයි රටේ හදිසි අවශ්‍යතාවයක් සඳහා ක්‍රියාත්මක වී කටයුතු කිරීම. පසුගියදා අභයගිරිය චෛත්‍ය ප්‍රතිසංස්කරණය කර නැවත විවෘත කිරීමේ අවස්ථාවේ දී ද අපි දන්සල් සමිතිය ක්‍රියාත්මත වී කටයුතු කළා. ඒ වගේම රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලදීත් අවශ්‍යතාවය මත දන්සල් කමිටුව ක්‍රියාත්මක වෙනවා.

**විවිධ සමිති සමාගම්වල තනතුරු රැසක් ඉසිලීමේ භාග්‍යයක් වරායේ දී ඔබට හිමිවුණා.**

වසර 35 ක මගේ වරාය සේවා දිවිය තුළ ඒ වාසනාව මට උපරිමයෙන් හිමිවුණා. ත්‍රි'මලය වරායේ සේවයේ සිටිය දී ත්‍රිකුණාමලය රෝහල් කමිටුවේ උප සභාපති ලෙසින් කටයුතු කළා. වරාය බෞද්ධ සංමයේ ජ්‍යෙෂ්ඨ උපසභාපති ලෙසින් කටයුතු කරනවා. ඒ වගේම මුලින් සඳහන් කළ දන්සැල් කමිටුවේත් එදා සිට අද දක්වාම කටයුතු කරනවා. ඒ වගේම සේවක සමූපකාර බැංකුවේ ලේකම් වගේම සාමාන්‍යාධිකාරී ලෙසින් කටයුතු කළා.

**කිසි දිනක් නැවක් නොදුටු ළමුන් පිරිසක් නැව් මෙහයුමට හුරු කරන්නත් ඔබ භාග්‍යවන්ත වූවා**

ඇත්තටම ඒක මං ලැබු භාග්‍යක් හැටියටයි සලකන්නේ. 2012 වසරේ දී ප්‍රධාන අධිකාරි ලෙසින් හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු කිරීමේ දී එම වරායට අනුයුක්ත කළ තරුණ පිරිසත් සමගින් කටයුතු කරමින් මේ පුහුණුවීම් සිදුකළා. 2012 ජුනි 4 වැනි දින එම දරුවන් නෞකාවට නැග මෙහෙයුම් කටයුතු කරද්දී මගේ දෑසට කඳුළු පිරුණා. මං විශ්වාස කරන දෙයක් තමයි අපි යමක් උපරිමයෙන් මනා වගකීමෙන්, සැබෑ හැඟීමෙන් ඉටුකරනවා නම් එය 100% ක්ම සාර්ථක වන බව.

**ඔබේ හෙට දවස ගැන කතා කළොත්**

සෑදෑ කාලය බෞද්ධ දර්ශනය සමග බද්ධව දැහැමිව ගෙවන්නට බලාපොරොත්තු වෙනවා. ආයතනයට මගෙන් විය යුතු සේවාව මං උපරිමයෙන් ලබා දුන්නා. මගේ ජීවිතය සාර්ථකයි. ඉදිරි කාලයත් දැහැමිව සෙමින් ගලා යාවි කියා හිතනවා.

# හෙළූ දහඩිය
# එකතු කළ රන්








# කඳුළු මුතු ඇට - ගෙවුණු පන්තිස් වස පුරා
# කර පුදන්නෙමු - ඔබෙ දිරිය අගයනු නිසා



12








# වරාය යාත්‍රා අ

## සිවි



සටහන :- දුමිඳු හඳගම

දු ජාතිකයින් මෙරට පාලනය කරන සමයේ සිට සියලුම යාත්‍රා නඩත්තු කටයුතු සිදුකළ කොළඹ වරායේ සුවිශේෂී බිම්කඩ පිළිබඳව මෙවර ''තීර්ථ'' තුළින් ඔබව දැනුවත් කිරීමටයි මේ වෑයම.

දැවයෙන් නිෂ්පාදනය කල යාත්‍රා අලුත්වැඩියා කිරිම කිසිසේත්ම ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි. ඒ සඳහා සුවිශේෂී වූ ශිල්පීය ගුණයෙන් යුතු ශිල්පීන්ගේ දායකත්වය අවශ්‍ය විය. අද මෙන් ''හයිඩ්‍රොලික්'' තාක්ෂණය නොතිබු එකල මෙම යාත්‍රා අලුත්වැඩියා කටයුතු විසල් ව්‍යාපෘති තරමටම සංකීර්ණ විය. එබැවින් ඒ සඳහා අතීතයේ විශාල කාර්ය මණ්ඩලයක සහාය ලබා ගැනීමට සිදුවිය. බොහෝ දැවමය කටයුතු මෙන්ම කැන්වස් ආවරණ කටයුතු බොහෝ කාලය සොරාගත් කටයුතු අතර ප්‍රමුඛ විය. නියමු යාත්‍රා දැව මාධ්‍ය යකඩ මාධ්‍ය දක්වා විකාශනය වීමත් සමග යාත්‍රා කටයුතු සමග බැඳී තිබු බැරෑරුම් තත්ත්වය මදක් සමනය විය. කම්බි කඹ (Vire Rope) ආධාරයෙන් සිදුකල කටයුතු මෙන්ම කැන්වස් ආශ්‍රිත කටයුතු වලට ද ආයුබෝවන් කීමට සේවක මහතුන්ට හැකිවිය.

අද දවසේ කොළඹ වරායේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට ජීවය දෙමින් යාත්‍රාවන්ගේ නඩත්තු කටයුතු, හදිසි ආපදා තත්ත්වයන් සඳහා විසඳුම් ලබාදීම, වරායට අදාල මුහුදු ප්‍රදේශයේ පවිත්‍රතාවය පවත්වාගෙන යාම ඇතුළු කාර්යභාරයන් රැසක් සිදුකරන වරාය යාත්‍රා අධිකාරි අංශය සේවක මහතුන් 233 කගේ සේවක ශක්තියෙන් අනූන ස්ථානයකි. සියලු පරිපාලනමය කටයුතු සඳහා දායකත්වය ලබාදෙන කළමණාකාර සහකාරවරුන්, නැංගුරම්පොල පරිපාලක, සරංගු, ලෝංච් කොක්සන්, ලෝන්ච් සුක්කානි, බෝට් කොක්සන්, නිරාවරණ කිමිදුම්කරු බෝට්ටුකරු I ශ්‍රේණිය, බෝට්ටුකරු II ශ්‍රේණිය, බහුවිධ නිපුණතා ශිල්පීන්, රියදුරු මහතුන් හා වැඩ සහායක මහතුන් අනන්‍ය වූ තනතුරු රැසක් ද මෙම පරිශ්‍රයේ දී හඳුනාගත





13



# කාරි අංශයට

# සමු



ජී.ඒ.එච්. පද්මසිරි මහතා
(ජ්‍යෙෂ්ඨ යාත්‍රා අධිකාරී)



පා වෙන දොඹකරය - **Floting Crain Giraf**

හැකි ය.

ටොන් 60 දක්වා බර එසවීම කලහැකි (පා වෙන දොඹකරය) Floting Giraf නම් වූ විශේෂිත දොඹකර අද දවසේ භාවිතයට නොගත්ත ද මෙම අංශය සතු ඉපැරණි මෙවලමකි.

නියමු මධ්‍යසථානයේ නැංගුරම්පොල පරිපාලක සරංගු ලොන්ච් කොක්සන් ආදි තනතුරුවල කාර්ය භාරය ද මෙම අංශය යටතේ සිදුවේ. මෙහිදි ලෝන්ච් කොක්සන් හට පැවරෙන කාර්යභාරයන් වගකීම් රැසක් උසුලයි. සරංගු විසින් ඒ ඒ පොරොත්තු ලේඛණයන්ට අදාලව දෛනික මුර ක්‍රමයන් යටතේ රාජකාරියෙහි යොදවන සේවක මහතුන් නම්කරන අතර, ලෝන්ච්, කොක්සන් ඇතුළු එසේ නම් කරන සේවක මහතුන් දෛනික රාජකාරී මුර ක්‍රමයන් යටතේ රාකාරියෙහි යොදවන සේවක මහතුන් නම්කරන අතර, ලෝන්ච් කොක්සන් ඇතුලු එසේ නම් කරන සේවක මහතුන් දෛනික රාජකාරි මුරයන් සඳහා සම්බන්ධව කටයුතු කරයි.



නැංගුරම්පොල පරිපාලක තනතුරේ රාජකාරී කිරීමේ දී නියමු නිලධාරියා හා සම්බන්ධ වී නෞකා ගැටගැසීමේ රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි.

වරාය මුවදොරට පිවිසෙන නෞකාවක් වෙත සමීප වී එහි වේගයට සමගාමීව යාත්‍රාවේ වේගය පවත්වා ගනිමින් ඕනෑම මුහුදු තත්ත්වයට ඔරොත්තු දිය හැකි අයුරින් යාත්‍රාව හසුරුවා ගැනීම සිදු කරන අතර, නියමු නිලධාරියා ඉනිමග ඔස්සේ නැවට නැගීම සිදුකර නෞකාව අදාල නැංගුරම්පොල වෙත රැගෙන ඒම සිදුවේ. නැංගුරම්පොල වෙත පැමිණි පසු දෑවැන්ත කඹ මගින් ආරක්ෂිත ගැටගසා ගැනීමේ කාර්යභාරය සිදුකරයි. අනතුරුව එම නෞකාව කොළඹ වරායෙන් පිටත්වීමේ දී ගැටගසන ලද කඹ ඉවත් කරයි. නෞකාව දියත්කල පසු පිටත වරායේ දී නියමු නිලධාරියා නැවත එම නෞකාවෙන් බැසීම සිදු කරන අතර, මේ සියලු කටයුතු මැනවින් ඉටු කිරීමට ලොන්ච් කොක්සන් භූමිකාව වෙසෙසින් ඉවහල් වන අතර මේ ක්‍රියාවලියට අවශ්‍ය සියලු සේවක මහතුන්ගේ ප්‍රශස්ත දායකත්වය මේ සඳහා හිමිවේ. නියමු නිලධාරියා නැවත රැගෙන ඒමද සිදු කරයි.

ඊට අමතරව ''Island Breakwater' වෙත පිවිසෙන ඉන්ධන රැගත් නෞකාවන් ගැටගැසීමට අවශ්‍ය සේවක මණ්ඩල සම්පාදනය හා ප්‍රවාහනය මෙන්ම, ගිනි නිවන හටයින් හා ආහාර පාන ප්‍රවාහනය ද මෙම මුවරින් යාත්‍රා මගින් සිදු කෙරෙන රාජකාරියකි.

එමෙන්ම, පිරිසිදු වරායක් කරා එළඹෙන ගමන උදෙසා ප්‍රවේශයක් ලබමින් කොළඹ වරායට අයත් මුහුදු ප්‍රදේශයේ පාවී එන ගොඩගැසෙන කැලි කසල, අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු සඳහා ද යාත්‍රා ක්‍රමෝපායන් සම්පාදනය කර ඇත. එමෙන්ම. වරාය විශේෂ අවශ්‍යතා සඳහා නැරඹීම් කටයුතු සිදුකිරීමේ දී ඊට අදාල යාත්‍රා සම්පාදනය මෙන්ම දායකත්වය ලබා දීම ද ජල ශ්‍රාස්ත්‍රිය මුහුදු මිණුම් කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම ද, වරාය යාත්‍රා අධිකාරි අංශය මගින් ඉටුකරනු ලබයි.

මේ පිළිබඳ වරාය යාත්‍රා අධිකාරි අංශය කියන්නේ වරායට ආදායම් උපද්දවා ලියහැකි ස්ථානයක්. යාත්‍රාවක නඩත්තු කටයුත්තක් පිටස්තර පාර්ශව ලවා සිදුකිරීමේ දී ගුණාත්මක තත්ත්වය පිළිබඳව බොහෝ විට අපට සෑහීමකට පත්වනේනට බැහැ. නමුත් වරාය අධිකාරියේ අපගේ සේවක මහතුන් යොදවා අපේ අංශයේ මෙම නඩත්තු කටයුතු සිදුකිරීම තුල ඉහළ ගුණාත්මක තත්ත්වයකින් වගේම කෙටි කාලයක් තුල හොඳ නිමාවක් ලබාදීමට පලපුරුදු අප සේවක මහතුන්ගේ හැකියාව හා දක්ෂතාවය තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය උපාංග හා අමුද්‍රව්‍ය නිසි පරිදි සපයාදීම තුළින් මේ අංශයේ කටයුතු කරන පෞද්ගලික අංශයට තරඟාකාරීත්වයක් ලබා දීමට අපට පුළුවන් බව මම විශ්වාස කරනවා. ජ්‍යෙෂ්ඨ යාත්‍රා අධිකාරි ජී.ඒ.එච්. පද්මසිරි මහතා පැවසුවේ තිර හඬින්.





තීරථ




04 කොටස

# තරු පහේ පුස්තකාලය



සුන්දර නින්ග්බෝවේ කාලය ඉතා වේගයෙන් ගලා යයි. අධ්‍යයන ක්‍රියාවලිය ඉතා වේගවත් ය. එහෙත්, පොලිටෙක්නික් දේශන ශාලාවේ එක දිගට ගතකරන සෑම පෙර වරුවක් ම ඉතා අසීරුතාවයකින් ගෙවා දැමීමට සිදුවෙයි. සැනසීමට ඇත්තේ අල්ලපු කාමරේ ඇති විස්කෝතු හා උණු කෝපි හෝ උණු වතුර පමණි. දිනපතා පැමිණෙන දේශකයෙකු චීන බසින් කරන විග්‍රහය, පරිවර්තකයෙකු විසින් ඉංග්‍රීසි බසට පෙරළයි. එක දිගට එය අසා සිටින කෙනෙකුට හිටි ගමන් චීන බස ද තේරෙන්නට පටන් ගන්නවාක් වැනිය. විටින් විට අල්ලපු කාමරයට ගොස් උණු වතුර ජෝගුව යලි පුරවා පැමිණීමත්, එසේ පැමිණෙන විට වර්ග කීපයක විස්කෝතු රැගෙන ඒමත්, නිසා සෑම මිනිත්තු විස්සකට වරක් "වොෂ් රූම්" එකට යාමේ නිදහස උදාවේ. එහෙත් යන විට දොර ඉතා සෙමින් ඇරීම හා වැසීම කළ යුතුය. මන්ද එහි චුම්බක අගුළු කැරකැවෙන හඬ දේශන ශාලාව පුරා රැඳී නිහඬ බව අසාමාන්‍යව බිඳ දමූ බැවිණි.

දිවා ආහාරය පිණිස දේශන නතර කිරීම මහත් ප්‍රමෝදයට හේතුවකි. එතැන් සිට පැය එකහමාරක පමණ කාලයක් විවේකය යි. නින්ග්බෝ පොලිටෙක්නික් භූමියෙහි හා අප නවාතැන් ගත් හෝටලය වෙත යන මඟ දෙපස ඇති ගහකොළ මේ කාලය තුළ කාබන් අංශු මිශ්‍රිත නිර්වායු ස්වසනය පිණිස ඉතා කාර්ය බහුල වන සෙයකි.

දිනක් සවස්වරුවේ දේශන අවසානයේ දී සම්බන්ධීකාරකවරයා පැමිණ සුභ පණිවිඩයක් දනුම් දුන්නේ ය. ඒ පසුදාට නියමිත දේශනය කල් දමා, අපව නින්ග් බෝ පුස්තකාලය නැරඹීමට රැගෙන යන බවයි. ඉතා අගනා ග්‍රන්ථ සමූහයකින් සුසැදි පුස්තකාලයක් නින්ග්බෝහි ඇති බවට මෙහි පැමිණ මුල් දින කිහිපය තුළදී චීන ශිෂ්‍යාවන් විසින් අපට පවසා තිබූ අතර විවේක දිනෙක අප එහි රැගෙන යන බවට ද පොරොන්දු වී තිබිණි. එය ඇත්තට ම අපේ අයිටිනරරියේ ද සටහන්ව තිබිණි. ඉදින්, නින්ග්බෝවෙහි තිබෙනවා යැයි අසා තිබුණු නවීන පුස්තකාලය සියැසින් දක බලා ගැනීමේ භාග්‍යය මහත් අස්වැසිලලක් වූයේ, එහි යාමට හැකි වන බව නිසාවෙන් ම නොව ඒකාකාරී දේශන රාමුවෙන් මිදීමට ලද නිවන් දොර විවරවීමක් වැනි වූ ද නිසාවෙනි.
චීන ශිෂ්‍යාවෝ පසු දින උදෑසන නින්ග්බෝ පොලිටෙක්නික් හි තරු පහේ පුස්තකාලය නැරඹීමට අපව  රැගෙන ගියහ. එය සුන්දර චාරිකාවකි. නින්ග්බෝහි බෙයිලුන් දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති මේ නවීන පුස්තකාලය, නින්ග්බෝ පොලිටෙක්නික් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ උදෙසාත්, සමස්ත බෙයිලුන් (Beilun) දිස්ත්‍රික් වාසී පාඨකයින් උදෙසාත් ඉදි කළ අති නවීන පහසුකමින් සුසැදි සිත නිවන පරිසරයකින් යුත් යෝධ ගොඩනැගිලි සංකීර්ණයකි.

මෙය මුලින්ම ස්ථාපනය කර ඇත්තේ 1985 දීය.  අනතුරුව 2011 වසරේදී බෙයිලුන් දිස්ත්‍රික් බලධාරීන් හා නින්ග්බෝ වෘත්තීය හා තාක්ෂණ විද්‍යාතනය ඒකාබද්ධව ඉදිකරන ලද, වර්ග මීටර 34,500ක භූමියකින් නව බෙයිලුන් පුස්තකාලය 2014 පෙබරවාරි මස විවෘත කෙරිණි.

ඒකාබද්ධ විවෘතභාවය තුළ සම්පත් බෙදා ගැනීම හා දැනුම් කළමනාකරණ සහයෝගීතා ප්‍රතිපත්තිය යටතේ ඉදි කෙරුණු මෙම නවීනතම නව බෙයිලුන් පුස්තකාලය, තාක්ෂණික විද්‍යාලයේ සිසු සිසුවියන්  හා බෙයිලුන් වැසියන්ගේ, පුස්තකාල විමර්ශන හා ග්‍රන්ථ බැහැර දීමේ ක්‍රියාවලියට නව අර්ථකතනයක් සපයා තිබේ. මෙය ඔවුන් හඳුන්වන්නේ, තාක්ෂණික විද්‍යාලය හා මහජන ජීවිතය අතර ඉතා සාර්ථක මඟුල් කෑමක් ලෙස ය. එපමණක් නොව මෙය බෙයිලුන් අයත්වන ෂෙජියෑං (Zhejiang Province) පලාතේ ඇති විශාලතම පුස්තකාලය ද වෙයි. ඉතා නවීන ස්වයං පාඨක සේවා සැපයුම් පද්ධතියක් හා පරිගණක ජාලගත සංයුක්ත පද්ධති පහසුකම් වලින් සමන්විත මුළුමනින් ම හරිත පුස්තකාල කලාපයක් ලෙස මෙය ඉදි කර තිබීම මෙහි ඉතා සුවිශේෂී ලක්ෂණයකි.

වර්තමානයේ දී නින්ග්බෝ පුස්තකාලය ග්‍රන්ථ පිටපත් 910,000න්, ඉලෙක්ට්‍රොනික ග්‍රන්ථ පිටපත් රාශියකින් 10,000ට අධික චීන බසින් සම්පාදිත විද්‍යා හා තාක්ෂණ සඟරා හා ග්‍රන්ථ ඇතුලත් විද්‍යුත් දත්ත ගබඩාවකින් ද යුක්ත ය.
මේ අතර, නින්ග්බෝ නගර නිර්මාණයේ දී යොදා ගත් ග්‍රැෆික් නිර්මාණ සැලසුම් පද්ධතිය සහ එහි යාන්ත්‍රික හා විදුලි නිර්මාණ පද්ධති දත්ත සමුච්චය ද මේ පුස්තකාලය සතු වෙයි.

මේ සියළු පහසුකම් විමර්ෂණය සඳහා ස්වයං පාඨක සේවා යටතේ පරිචුම්බන පහසුකම් ද සපයා තිබේ.

සේවා නවෝත්පාදනය නින්ග්බෝ නව පුස්තකාලයේ අනාගත සංවර්ධන සැලසුම් අතර මූලික කරුණක් බව එහි

සටහන  : හර්ෂ උදයකාන්ත පීරිස්
(Text  by: Harsha Udayakantha Peiris)
Special Thanks to Shanhan (Leila Li)




නවීන ස්වයං සේවා ඉලෙක්ට්‍රොනික බැහැර දෙන පද්ධතියක්



පුස්තකාල බිමෙහි ඉදිවුණු සිහිලස ගෙනදෙන සුවිසල් පොකුණු මණ්ඩලය, සේවකයින් පිරිසක් පුස්තකාල ගොඩනැගිල්ල සෝදා පිරිසිදු කරන අයුරු හා එදෙස බලා සිටින පිරිස්





නින්ග්බෝ පොලිටෙක්නික් පුස්තකාලයේ මනරම් දසුන්





**ස්වයං සේවා ඉලෙක්ට්‍රොනික දත්ත විමර්ශන පද්ධතියක්**

නිළධාරීහු අප හා පැවසූහ. ඉතා උසස් තත්ත්වයේ සම්පත් හා සේවා පහසුකම් සපයන, ඉගෙනුම් හා දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානයක් ලෙසත්, දැනුම බෙදා හදා ගැනීමේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙසත් මේ වන විට ක්‍රියාත්මක නින්ග්-බෝ පොලිටෙක්නික් තාක්ෂණ විද්‍යාලයට අයත් බෙයිලුන් හි මෙම නව පුස්තකාලය ලේඛනගත පුස්තකාල සම්පත් හා විද්‍යුත් දත්ත විමර්ශණ පහසුකමින් යුත් චීනයේ ඇති අති සුබෝපභෝගී තරු පහේ නවීන පුස්තකාලයක් ද වෙයි.

**(නින්ග්බෝහි වැසියන්ට පෝෂණය සපයන නින්ග්බෝ මුහුදු ආහාර පොල - මීලඟ කලාපයෙන්)**

# ස්ථූලතාවය මනිමු (Measuring Obesity)

ස්ථූලතාවය මැනීම සඳහා දර්ශක කිහිපයක් ඇති අතර, ඉන් ඉතා පහසුවෙන් මැනියහැකි දර්ශක දෙකක් පිළිබඳ සලකා බලමු.

1. ශරීර ස්කන්ධ දර්ශකය
   Body Mass Index (BMI)

- ඉතා පහසුවෙන් මැනියහැකි මූලික දර්ශකයකි.
- ශරීරයේ තැම්පත් මේද ප්‍රමාණය පිළිබඳ නිවැරදි අදහසක් ලබා දේ.
- බෝ නොවන රෝග සහ අකල් මරණ ඇතිවීමට ප්‍රවණතාව පිළිබඳ අනතුරු ඇඟවීමක් ලබා දේ.
- ශරීරයේ බර (ස්කන්ධය) කිලෝග්‍රෑම් (kg) වලින් මැනගන්න.
- ශරීරයේ උස මීටර් (M) වලින් මැනගන්න
- පහත සඳහන් සූත්‍රයට එම අගයන් ආදේශ කර ශරීර ස්කන්ධ දර්ශකය සොයාගන්න

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය (Body Mass Index)} = \frac{\text{බර (kg)}}{\text{උස (M) උස (M)}}$$

**උදාහරණය**

උස 174cm වන හා බර 65kg වන පුද්ගලයකුගේ BMI අගය

$$BMI = \frac{65\ kg}{1.74\ m \times 1.74\ m} = 21.4\ kg/M^2$$

**ඔබගේ ශරීර ස්කන්ධ දර්ශකය,**

$18.5\ kg/M^2$ වඩා අඩු නම්, අඩු බර තත්වයද

$18.5\ kg/M^2 - 25\ kg/M^2$ අතර නම් සුදුසු බර ද

$25\ kg/M^2 - 30\ kg/M^2$ අතර නම් අධි බර ද

$30\ kg/M^2$ වඩා වැඩි නම් ස්ථූලතාවය ද ඇති බව සැලකිය යුතුය.

**ඉනේ වටප්‍රමාණය**
(Waist Circumference)

ඉතා පහසුවෙන් මැනිය හැකි මූලික දර්ශකයකි. ස්ථූලතාවය ප්‍රමාණය පිළිබඳ නිවැරදි අදහසක් ලබා දේ. බෝ නොවන රෝග, විශේෂයෙන්ම දෙවන වර්ගයේ දියවැඩියාව (Type II) වැළදීමට ඇති හැකියාව පිළිබඳ නිර්ණායකයන් මෙමගින් ලබා දේ.

අවසාන පර්ශු (ඉල ඇට) මට්ටම සහ උකුල් අස්ථියේ උඩ මට්ටමත් අතර හරි මැද මට්ටමේ වට ප්‍රමාණය ටේප් පටියකින් මැන ගන්න.

පිරිමි අයෙකුගේ ඉනේ වට ප්‍රමාණය 90 CM විය යුතු අතර කාන්තාවකගේ එය 80 cm නොඉක්ම විය යුතු ය.

ස්ථූලතාවය හෘදයාබාධ, අධි රුධිර පීඩනය, අංශභාගය, දියවැඩියාව, හංදි ප්‍රධාන වැනි රෝග ඇති වීමට අවධානම් සාධකයකි. මෙවැනි රෝග තත්ව වල ඇතිවීම වැලැක්වීමට ශරීරයේ බර පාලනය කර ගැනීම අනිවාර්ය වේ.

**ශරීරයේ බර අඩු කර ගැනීමට සරල සැලසුමක්**

ශරීරයේ බර අඩු කිරීම කෙටි කාලයකදී සිදු නොකල යුතු අතර ක්‍රමානුකූලව සිදු කළ යුතුයි. සතියකට අඩු කරගත යුතු බර ප්‍රමාණය 0.5 kg වේ. ශරීරයේ බර අඩු කර ගැනීමට ප්‍රධාන ආහාර වේල 03 මගහැරීම සිදු නොකළ යුතුයි. නමුත් ප්‍රධාන ආහාර වේල් වල ප්‍රමාණය අඩු කළ යුතුයි. ප්‍රධාන කෑම වේල් 03 අතරට අමතරව සුලු කෑම වේල් 02 එකතු කරගත හැක.

| ප්‍රධාන කෑම වේල | සුලු කෑම | ප්‍රධාන කෑම වේල | සුලු කෑම | ප්‍රධාන කෑම වේල |
|---|---|---|---|---|
| | සැන්විච් එකක් හෝ කෙසෙල් ගෙඩියක් | | සීනි රහිත බිස්කට් 02-03 හෝ ගස්ලබු තීරුවක් | |

ඔබේ ප්‍රධාන ආහාරවේලේ
- 1/2 පිශ්ඨය සහිත විය යුතුයි (උදා : බත්/අල/කොස්/දෙල්)
- 1/3 පලා වර්ග සහ එළවලු විය යුතුයි (උදා : වැටකොලු/දඹල/මැකරල්/බෝංචි/ගොටුකොල/මුකුණුවැන්න/කතුරුමුරුංගා)
- 1/6 ශාක සහ සත්ව ප්‍රෝටීන විය යුතුයි (උදා : මුං ඇට/පරිප්පු/සෝයා මස්/මාලු/කරවල)

සීනි, ලුණු, තෙල් භාවිතය අඩු කළ යුතුය. දිනකට පිරිසිදු පානීය ජලය ලීටර් 03-04 පමණ පානය කළ යුතු යි. නියමිත බරක් පවත්වාගෙන යාමට දිනකට විනාඩි 30ක් ස්වායු ව්‍යායාමක යෙදිය යුතුයි

ඇවිදීම, බයිසිකල් පැදීම, පිහිනීම වැනි ක්‍රීඩා අභ්‍යාස මේ සඳහා වඩාත් යෝග්‍ය වේ.

මෙම සරල සැලසුම අනුගමනය කිරීම තුළින් ඔබේත්, ඔබේ සමීපතමයන්ගේත් යහපත් සෞඛ්‍යමය තතත්වයක් පවත්වාගෙන යාමට ඉවහල් වනු ඇත

**උපදෙස් හා සටහන - වෛද්‍ය චින්තක සේමසිංහ**

# වරාය හා නාවික සේවා දැනුම අත්වැල

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්ත්වය කෙරෙහි වරාය හා නාවික සේවාවන් ඉමහත් සේ වැදගත් වේ. මෙකී සේවාවන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය රටේ ජාතික ආර්ථිකය ඉහළ නැංවීමට දැඩි බලපෑමක් ඇති කරයි. වෙළඳාමෙන් දළ ජාතික නිෂ්පාදනයට ලබාදෙන දායකත්වය වැඩිවන ප්‍රමාණයට වරාය හා නාවික සේවාවන් අගය ද ඉහළ යනු ඇත. මෙමගින් පෙනී යනුයේ වරායයන්, වරාය ආශ්‍රිත සේවාවන්, නාවික ව්‍යාපාර කටයුතු හා අනෙකුත් අදාල අනුසාංගික සේවාවන් සෘජුව හා වක්‍ර මාර්ගයෙන් රටේ ආර්ථිකයට ලබා දෙන දායකත්වය අතිශයින් වැදගත් වන බවයි.

වරාය හා නාවික සේවාවන් ඇතුළු සමුද්‍රීය සේවාවන් මේ ලෙසින් ගොණු කළ හැකිය.

- වරායයන්හි පර්යන්තවල මෙහෙයුම් සේවා
- නැව් සමාගම් ලබා දෙන සේවා
- නැව් නියෝජිත ආයතන ලබාදෙන සේවා
- නැව්වලට ඉන්දන සැපයීමට අදාල සේවා
- නැව්වලට ආහාර ද්‍රව්‍ය හා ගබඩා ද්‍රව්‍ය සැපයීමට අදාල සේවා
- නැව් අලුත්වැඩියා කිරීමට අදාල සේවා
- නාවික කටයුතුවලට අදාල යාත්‍රා ඉදිකිරීමට අදාල සේවා.
- නැව්බඩු ඉදිරිපත් කිරීමට අදාල සේවා.
- නැව්බඩු ප්‍රේෂණ කටයුතුවලට අදාල සේවා
- බහලු මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අදාල සේවා.
- නැව්බඩු ඒකාබද්ධ කිරීමට අදාල සේවා
- නාවික සමීක්ෂණ කටයුතුවලට අදාල සේවා
- ප්‍රවාහන සේවා සැපයීමට අදාල සේවා
- නාවික රක්ෂණ කටයුතු ඉටුකිරීමට අදාල සේවා
- භාණ්ඩ ආනයනය කිරීමට අදාල සේවා
- භාණ්ඩ අපනයනය කිරීමට අදාල සේවා
- සමුද්‍රීය පුහුණු ආයතන පවත්වාගෙන යාමට අදාල සේවා
- ආශ්‍රිත සහාය සේවා සැපයීමට අදාල සේවා

ශ්‍රී ලංකාව පෙරදිග හා අපරදිග අතර නැව් ගමන් හා මුහුදු මාර්ගයට ඉතා ආසන්නයේ පිහිටි දූපතක් හෙයින්, අප රට තරඟාකරී සමුද්‍රීය හා සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරීමට ඇති ඉඩකඩ ඉමහත්

17 පිටුවට



## සිතන්න......... මේ ගෙවී යන්නේ ඔබේත්, මගේත්

# ජීවිත වල සුන්දරම හා අවසාන නිමේෂයයි .........!

"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තෝ - දුකඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨෝසි - පුන ගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"

'' සත්වයාගේ නැවත ඉපදීම දුකකි. එබැවින් මේ ආත්මභවය නමැති ගෘහය සාදන වඩුවා සොයමින් නොයෙක් ජාතීන් හී ඉපිද බොහෝ කල් සසරේ ඇවිද්දෙමි. එම්බා වඩුව, මම තා දුටුවෙමි. තොපට නැවත මේ ගෘහය සැදිය නොහැක. තාගේ සියලු කෙළෙස් නමැති පරාල මම බිඳ දැමුවෙමි. එහි කැණි මඩල සුනුවිසුණු කළෙමි. තෘෂ්ණාව මුලිනුපුටා දමා මම නිර්වාණය අවබෝධ කළෙමි''

මේ වනාහි කෙළෙස් සතුරන් නසා ලොව විනිවිද දකින ප්‍රඥාව හෙවත් සම්මා සම්බුද්ධ ඥානය අවබෝධ කරගැනීමත් සමගම අපගේ අමා මෑණි වූ සම්බුදු පියාණන් වහන්සේ විසින් සිංහ නාද කළ උදාන වාක්‍යයයි. සාහිත්‍යමය පද ගැලපුමෙහි මිහිරියාව අනුව මේ උදාන වාක්‍යය අතිශය අසිරිමත්ය. අතිශය සුන්දරය. එහෙත් ඒ තුළ ගැබ්ව ඇති පරතෙරක් නැති ගැඹුර ඔබත් මමත් කවර නිමේෂයකදී හෝ වටහා ගන්නට උත්සාහ කළේ ද? සාර අසංඛ්‍යය කල්ප ලක්‍ෂයක් පාරමී දම් පුරා අප සියලු දෙනා වෙනුවෙන් මේ ගැඹුරු අවබෝධය ලබාගන්නේ බෝධිසත්වයන් වහන්සේගේ අතිශය කටුක හා කර්කෂ භවගාමී අත්දැකීම් සමුදායක අග්‍ර ඵලය ලෙසය. එහෙත් මනුෂ්‍යයින් වන අප සැවොම මිනිසත් බවත්, බුද්ධොත්පාද කාලයත්, ක්‍ෂණ සම්පත්තියත්, ශ්‍රී සද්ධර්මයත් යන දුර්ලභ කරුණු හතරෙහිම වාසනාවන්ත හිමිකරුවන් ලෙස බොහෝ උද්දාමයටත්, ප්‍රීති ප්‍රමෝදයටත් පත්වෙමින් 'බුද්ධං සරණං ගච්ඡාමි' ලෙසින් අප බුදුන් සරණ යන්නේ කොපමණ සැහැල්ලුවෙන් හා සරලවද?

භවගාමී සසර ස්වභාවය තුළ ජාති ජරා මරණ හෙවත් නැවත ඉපදීම, දිරායාම, ලෙඩවීම, මියයාම මෙන්ම ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම, සතර අපා දුක ආදි වශයෙන් පංච උපදානස්කන්ධයම දුක් සහිත බැවින් මේ සසර සත්වයාට පාලනය කළ නොහැකි සැඩ පහරක් හෙවත් සංසාර ඕඝයක් ලෙස බුදුන් නිර්වනය කරයි.

එහෙත් හිරු උදාවේ සිට හිරු බැසයන තෙක් අප්‍රමාදිව හිරුගෙන් ගත යුතු ප්‍රයෝජන නොමදව ලබාගන්නට වෙහෙසෙන අප සැවොම මේ දුර්ලභ කරුණු සුසංයෝගයෙහි ආලෝකය අපට හිමිවුයේ එහි ආශ්වාදය විඳින්නට නොව ඊට අනුගතවී සසරින් මිදෙන මාර්ගය පසක් කරගැනීමට බව අමතක කර ඇත. නොනිමි ලෞකික කාර්ය සමුදායක ලෞකික කාර්ය පෙළහරක නිරත ඔබටත් මටත් මේ පිළිබඳව සිතන්නටවත් ඉඩ හසර නැති බවක් පෙනේ.

මෝහය නමැති කඩතුරාවෙන් යථාවබෝධය බොඳ කරගත් බොහෝ මිනිසුන් මේ ජීවිතයේ දුක සැපක් ලෙසම සිතයි. පර තෙරක් නැති සංසාර සාගරයෙහි අනේක දුක්ඛයන් පිළිබඳව තීරණය කිරීමේ මිණුම් දණ්ඩ ලෙස මේ ජීවිතය යොදාගන්නා මානවයා, සතර අපා දුක කෙසේ හඳුනයිද? යන්න ප්‍රශ්ණාර්ථයකි. අනියත වූ ස්කන්ධ ධාතු පරම්පරාවන්හි පැවැත්ම අතිශය දුකකි. නැවත ඉපදීම ඇතිකරන කාම තණ්හාව භව තණ්හාව, විභව තණ්හාව යන තෘෂ්ණාවන් ප්‍රහීන කිරීමෙන් පමණක් සනාතනික සුවය අවබෝධ වනු ඇත. පංචේන්ද්‍රියන්ට ගෝචර වන්නාවූ අරමුණු වලින් එම ඉඳුරන් පිනවීම කාම තෘෂ්ණාවයි. එනම්, කාම භවයෙහි කම්සැප විඳීමට ඇති දැඩි ආශාවයි. කාමභව වලට අමතරව ඉන් සෑහීමට පත් නොවී රූපී අරූපී භව වල සැපතට ආශාවෙන් ධ්‍යාන මගින් ඒ ඒ ලෝකවල සැප ලැබීමේ ආශාව මත සත්වයා සාදාකාලික යයි සිතා ඇති කරගන්නා ශාස්වත දෘෂ්ඨිය භව තණ්හාවයි. මරණින් පසු උපතක් නැතැයිද එබැවින් විඳිය යුතු දේ මේ ජීවිතය තුළදී විඳිය යුතුය යන අදහසින් අරමුණු වලට ලොල් බව විභව තණ්හාවයි.

මේ තෘෂ්ණාව හේතුකොට ගෙන දැඩි ආශාව හෙවත් උපධානයත්, උපධානය හේතුකොට ගෙන භවයත්, භවය හේතුකොට ගෙන ඉපදීමත් සකස් කරගන්නා සත්වයා ඉපදීමේ ප්‍රතිඵලය ලෙස ජරා මරණ, ශෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස ආදි දුක් රැසකට මාර්ගය විවෘත කරගනියි.

මිනිසත් බැව් ලබා ඇති අප සැමට හේතුව ප්‍රහීන කර දුක ප්‍රහීන කිරීමට ලැබී ඇති අතිශය සුන්දර අසිරිමත් හා අවසාන මොහොත මෙයයි. අතීත කුසල් සංස්කාර පාධක කරගෙන අද අප සියලු දෙනා මිනිසත් බව ලබා තිබුනද, ලෝක සත්වයාගේ භව ගමනෙහි 'මහගෙදර' සතර අපාය බව බුදු මුවින් පවසා ඇත. ඒ අනුව මේ ලැබී ඇති ආලෝකයෙන් ආලෝකය කරාම ප්‍රවිශ්ඨ වීමට මංපෙත් හෙළිකර ගන්නට අපොහොසත් වුවහොත් අනිවාර්යයෙන්ම අපට හිමි ඊළඟ උපත සතර අපායෙන් එකක්ය යන්න විවාද රහිතය.

ධම්ම පදයෙහි අත්ත වග්ගයෙහි මෙසේ සඳහන් වේ.

අත්තානං චේ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්නමඤ්ඤතරං යාමං - පටිජග්ගෙය්‍ය පණ්ඩිතෝ

තමා තමාට ආදරය දක්වන්නේ නම් ඔහු තමා රැක ගත යුතුය. එවැනි වු පණ්ඩිත තෙමේ ජීවිතයෙහි බාලවියේ දී නොහැකි නම් මැදිවියේදි නොහැකි නම් මහළු වියේදී හෝ යන අවස්ථා තුනෙන් එකකදී කුසල් මගට පිවිස තමා පෝෂණය කරගන්නේය.

දුක් නිවාරණය කර නිර්වාණ සුවය අවබෝධය කරා පිවිසෙන්නාවු ආර්ය ශ්‍රාවකයාට ඒ සඳහා අනුගමනය කල යුතු ඒකායන මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය ලෙස ලොව්තුරා අමා මෑණියන් වහන්සේ දේශනා කළ සේක. ඉතා සුපැහැදිලි අඩියර අටකින් සමන්විත මෙම දුක්ඛ නිරෝධ ගාමිණි ප්‍රතිපදා ආර්ය සත්‍ය හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි සුවිශේෂි ලක්‍ෂණය වන්නේ එය අනු පිළිවෙලින් වැඩිය යුතු වීමයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ග අංග අට, එකී අනු පිළිවෙලට වැඩිය යුතු වන්නේය. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ප්‍රවේශ දොරටුව සම්මා දිට්ඨිය වන අතර, සම්මා දිට්ඨියට ප්‍රවේශ දොරටුව වන්නේ කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය හා නුවණින් මෙනෙහි කිරීම ම වේ.

එබැවින්, අතිශය දුර්ලභ වු මිනිසත් බවක් ලද, එහෙත් බුද්ධ දේශණයට අනුව ලෞකික සුවයේ ආශ්වාදය අභියස ආදිනවය අමතකව අතිශය භයානක සංසාර අවදානමක වෙසෙන ඔබටත් මටත් මේ ගතවන නිමේෂය කෙතරම් තීරණාත්මකද..? සිතන්න, මේ ගෙවී යන්නේ ඔබේත්, මගේත් ජීවිත වල සුන්දරම හා අවසාන නිමේෂයයි එසේ නම්, ඊට පිළිතුර ගැබ්වී තිබෙන්නේද අප කවුරුත් අසා ඇති අවසන් බුදු ඔවදන තුළමයි.

අප්පමාදෝ අමත පදං - පමාදෝ මච්චුනෝපදං
අප්පමත්තා න මීයන්ති - යේ පමත්තා යථා මතා

සටහන - එස්.එම්. තිලකපාල (මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය)



# වාර්ෂිකව ගිගා වොට් පැය 300 ක බලශක්තියක් ඉතිරි කර ගැනීමේ මහා සංග්‍රාමය

## එක්සත්ව එක්සිත්ව පෙළ ගැසෙමු

### ඔබ දන්නවාද..?

- විදුලිබල ජනනය සඳහා ඛණිජ තෙල් ආනයනය කිරීම සඳහා ජාතික ආදායමෙන් 25%ක් වාර්ෂිකව වැය වන බව..?
- ඔබ වෙත සපයනු ලබන විදුලිය 25%ක ප්‍රමාණයක් අකාර්යක්ෂම භාවිතය නිසා අපතේ යන බව..?
- බලශක්ති සුරක්ෂිත කිරීම සඳහා මේ දේශයේ පුරවැසියෙකු ලෙසින් ඔබට විසල් වගකීමක් ඇති බව

### එසේ නම්

- ඔබ කාර්යාලයේ නොමැති අවස්ථා වල දී සියලුම විදුලි උපකරණ ක්‍රියා විරහිත කිරීමට කටයුතු කරමු.
- ඔබ කාර්යාලයෙන් පිටවීමට පෙර සියලුම විදුලි උපකරණ ක්‍රියා විරහිත කිරීමට වල බලා ගනිමු.
- ආයතනයට විදුලි උපකරණ මිල දී ගැනීමේ දී ඒවායේ බලශක්ති කාර්යක්ෂමතාව, ජීවන චක්‍ර වියදම යන පරිසර හිතකාමී බව පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වමු.
- හැකි සෑම විට ම සූර්ය බල ශක්තිය භාවිතයට ඇති අවකාශය පිළිබඳ සොයා බලමු.

### ඔබ විදුලි පහන් භාවිතයේ දී

- අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීමට කටයුතු කරමු.
- ප්‍රති දීප්ත පහන් භාවිතයේ දී වඩා සිහින් ප්‍රති දීප්ත පහන් භාවිත කිරීමට කටයුතු කරමු.
- ප්‍රති දීප්ත පහන් භාවිතයෙන් ඉවත් වන විට LED පැනල් වර්ගයේ ප්‍රභවයන් යොදා ගැනීමට පියවර ගනිමු.

### වායු සමීකරණ භාවිතයේ දී

- වායු සමීකරණ යන්ත්‍ර නිසි ලෙස නඩත්තු කිරීමට පියවර ගනිමු.
- ඔබ කාර්යාලයෙන් පිටවීමට පැය 1/2කට පෙර වායු සමීකරණ යන්ත්‍ර පද්ධතිය ක්‍රියාවිරහිත කිරීමට කටයුතු කරමු.
- සති අන්තයේ වැඩ කරන දින වල සුළු සේවක පිරිසක් රැඳී සිටින විට වායු සමීකරණ වෙනුවට හැකි පමණ විදුලි පංකා භාවිතා කරමු.

### කාර්යාලීය උපකරණ භාවිතයේ දී

- පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ආදිය වැඩි කාලයක් තුළ භාවිත නොකරන විට නිද්‍රා අවස්ථාවේ නොතබා ක්‍රියා විරහිත කර තබමු.
- තේ සෑදීම සඳහා ජලය රත් කරන විට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය භාවිත කිරීමට පියවර ගනිමු.
- සෑම විට ම උපකරණයක් මිල දී ගන්නා විට බලශක්ති ලේබලයක් තිබේදැයි පරීක්ෂා කර බලමු.

ආයතනයට, රට ට හිතැති ඔබ,
මෙවැනි ක්‍රියාමාර්ග තුළින්
බල ශක්ති ඉතිරි කිරීමට දායක වෙමු.




සටහන -නිමේෂා අයේෂානි

අද අප රටේ කාන්තාවන්ගෙන් බොහෝ දෙනෙකු සම පැහැපත් කිරීම සඳහා බිලිචිං ක්‍රීම් පාවිච්චි කර අමාරුවේ වැටෙන බව නොරහසකි. සම පැහැපත් කිරීම සඳහා ගෙදරදීම සාදාගත හැකි ප්‍රතිකර්මයක් අද අපි ඔබට කියලා දෙන්නෙමු.

**අවශ්‍ය ද්‍රව්‍ය**

අල ගෙඩි 1 ක්, කැරට් අල 1/2 ක්, අලෝජෙල් තේ හැන්දක්, කස්තුරි කහ තේ හැන්දක්, සුදු හඳුන් කුඩු තේ හැන්දක්, වෙන්වැල් ගැට කුඩු තේ හැන්දක්, රෝස වතුර තේ හැදි 2 ක්

**සාදාගන්නා ආකාරය**

අල ගෙඩියක් බ්ලෙන්ඩ් කර යුෂ පෙරා ගන්න. ඉන්පසු කැරට් අල 1/2 ද එලෙස බ්ලෙන්ඩ් කර යුෂ පෙරා ගන්නා. ප්ලාස්ටික් භාජනයක් ගෙන බ්ලෙන්ඩ් කර යුෂ පෙරා ගත් අල සහ කැරට් එයට එකතු කරන්න. එයට අලෝජෙල්, කස්තුරි කහ, සුදු හඳුන් කුඩු, වෙනිවැල්ගැට කුඩු, රෝස වතුර එක් කරන්න. පසුව එම මිශ්‍රණය නැවත ක්‍රීම් එකක් වනතුරු බ්ලෙන්ඩ් කරගන්න.

**පාවිච්චි කරන ආකාරය**

සාදාගත් මිශ්‍රණය මුහුණ පුරා උඩු අතට ඇලේප කරන්න. පසුව මසාජ් කර විනාඩි 5 කින් පමණ මුහුණ සිසිල් ජලයෙන් සෝදා හරින්න. මෙම මිශ්‍රණය සතියක් පමණ ශීතකරණයේ දමා පාවිච්චි කළ හැකි ය.

15 පිටුවෙන්

## වරාය හා නාවික සේවා දැනුම අත්වැල

ය. මෙකී අපේක්ෂාවන් සාර්ථක කර ගැනීම සඳහා මූලික අවශ්‍යතාවයන් ගණනාවක් සම්පූර්ණ විය යුතුය. එනම්,

- ශ්‍රී ලංකාවට ආනයනය කරන සහ මෙරටින් අපනයනය කරන භාණ්ඩ හා ප්‍රතිඅපනයන භාණ්ඩ කාර්යක්ෂම හා ඵලදායි ලෙස මෙහෙයවිය හැකි අයුරින් අපගේ වරායන් සංවර්ධනය කිරීම.
- අන්තර්ජාතික වෙළෙඳාමට, කලාපීය ප්‍රතිඅපනයන භාණ්ඩ ප්‍රවාහනය හා වෙරළාසන්න භාණ්ඩ ප්‍රවාහනයට යෝග්‍ය පරිදි තරගකාරි කටයුතු කළ හැකි ජාතික වෙළෙඳ නැව් සේවාවන් පවත්වාගෙන යාම.
- දේශීය හා විදේශීය වෙළඳ නැව්වල සේවයේ යෙදිය හැකි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නිපුනත්වයෙන් හා දැනුමින් යුත් නැව්වල කාර්ය මණ්ඩල සාමාජිකයින් පුහුණු කිරීම.
- ආනයන හා අපනයන කරුවන්ට මෙන්ම දේශීය හා විදේශීය ආයෝජකයන් සැහීමකට පත්වන අයුරු උසස් මට්ටමේ සේවා සැපයුම් පහසුකම් ඇති කිරීම.
- යාත්‍රා ඉදිකිරීම හා නැව් අලුත්වැඩියා කටයුතු පුළුල් කිරීම සමුද්‍රීය කටයුතුවලට අදාල සේවාවන්හි යුරෝපා කොමිෂමට අයත් රටවල පමණක් සේවයේ යෙදී ඇති සේවක සංඛ්‍යාව ලක්ෂ 30 කට අධික වේ. මේ අනුව අප රටේ වරාය හා නාවික සේවාවන් හා ඒ ආශ්‍රිත සේවාවන්හි රැකියා අවස්ථා ලබා දිය හැකි අවස්ථාවන් ද ඉතා ඉහළ තත්ත්වයක පවත්වාගෙන යාමට ඉහත සඳහන් සේවාවන් පුළුල් කිරීම මගින් හැකිවනු ඇත.

# புத்ததாண்டில் புதுப்பொழிவு பெறுவோம்

மாற்றங்கள் தொடர்பில் பல வேறுபட்ட கலந்துரையாடல்கள் முன்னெடுக்கப்பட்ட போதிலும் மாற்றங்களை ஏற்படுத்துவது கடினமாகும். ஆனால் நீங்கள் இவ் ஆண்டில் மாற்றத்திற்கான முதற்படியை எடுத்து வைக்க வேண்டுமென நான் உங்களிடம் மிக அன்புடன் கேட்டுக்கொள்கின்றேன். இவ்வாண்டில் அறிவை மற்றும் புரிந்துணர்வை வளர்த்துக்கொள்வதற்கான வழியை வகுத்துக்கொள்ள வேண்டும். புதிய அறிவுத்திறன் ஊடாகவே வாழ்வினை புதிய வடிவில் காண இயலும். எதிர்கால நிகழ்வுகள் மிக விரைவாக நடந்தேறும். எனவே எதிர்காலமானது மிக புதிய சந்தர்பங்கள் மற்றும் எச்சரிக்கைகளுடன் உங்களை நெருங்கும். எச்சரிக்கைகளை கடந்து சந்தர்ப சூழ்நிலையின் மூலமாக பலன் பெற வேண்டுமாயின் உங்களை சுற்றி நடைப்பெறும் நிகழ்வுகள் தொடர்பில் கூர்மையான அவதானத்துடன் செயற்பட வேண்டும்.

எந்த ஆண்டிலேனும் குறிக்கோளை வெற்றிக்கொள்ளும் பொருட்டு பணியாற்றுவது என்பது இலகுவான காரணியல்ல. நாம் எண்ணும் இலக்கை எம்மால் முழுமையாக அடைய இயலுமென நாம் எத்தனை தடவைகள் நினைத்திருப்போம். ஆனால் நாம் மனதுள் நினைத்ததை மிக விரைவாகவே மறந்துவிடுகின்றோம்.

நீங்கள் உங்களை நோக்கி ஒரு கணம் திரும்பி பாருங்கள். உங்களிடம் எவ்வளவு ஆற்றல்கள் உள்ளன? 1982ம் ஆண்டு அவுஸ்திரேலியாவின் மெல்பேர்னில் பிறந்த நிக் வஜுஅடிக் பிறவியிலே கை, கால்களை இழந்தவராவார். எம்மால் நினைக்க முடியாத அளவிற்கு நிகஸ் நீந்துவதற்கு, பாலூட்டுவதற்கு, டிரம்ஸ் இசைப்பதற்கு மற்றும் மேலும் பல செயல்களை செய்வதற்குக தான் திறமையானவர் என்பதை உலகிற்கு நி'ரூபித்துள்ளார். அதுமாத்திரமன்றி இம்மிலேனிய ஆண்டில் புகழ்பெற்ற நேர்மறை சிந்தனை விரிவுரையாளராக உலகோரின் மனதை வென்றுள்ளார். உங்களுக்கு இவ்வாறானதோர் நிலை ஏற்பட்டிருந்தால் நீங்கள் எவ்வாறு செயற்பட்டிருப்பீர்கள் என ஒரு கணம் சிந்தியுங்கள். விகாரைகள், கோயில்கள், தேவாலயங்களிடையே மற்றும் வைத்தியச்சாலை வரிசைகளில் நாம் ஒரு குழந்தையை போல் நடாத்தப்பட்டிருப்போம். மன வலிமை மற்றும் தொடர்ச்சியான பயிற்சியின் மூலமாகவே இவர் முழு உலகையும் வென்றுள்ளார்.

இவ்வாறு கற்பனைக்கு மாத்திரமே வரையறுக்கப்பட்ட ஒரு சில குறிக்கோள்களை சிறு மனிதர்கள் தனியாக வெற்றிக் கொண்ட கதைகளை உலகம் முழுவதும் அறியக்கிடைக்கின்றது. இவ்வனைத்து செயற்பாடுகளும் சட்டதிட்டங்களிற்கு வரையறுக்கப்படவில்லையென இச்சந்தர்பத்தில் எமக்கு நன்கு புலனாகின்றது. குறிக்கோளை வெற்றிக்கொள்ளும் பயணத்தில் நீங்களே முடிவுகளை மேற்கொள்ள வேண்டும். வெற்றியை போன்று தோல்வியையும் நீங்களே சந்திக்க நேரிடும். எனவே நான் இவ்வாறு கூற விரும்புகின்றேன்,உங்களது வெற்றி சான்றிதழை நீங்களே எழுதிக்கொள்ள வேண்டும். இப்பயணத்தின் பொழுது உங்களிடமிருக்க வேண்டிய சான்றிதள்கள் தொடர்பில் நான் நினைவுக்கூற விரும்புகின்றேன்.

### *முக்கியமான நபராக இருத்தல்*

நீங்கள் நல்லதோர் குறிக்கோளை நோக்கி முன்னோக்கிச் செல்கையில் அதன் பொருட்டு செயற்படுகையில் நீங்கள் கட்டாயம் முக்கியமான நபராக இருக்க வேண்டும். குறிக்கோள் நிறைவேற வேண்டுமாயின் நீங்கள் மேற்கொள்ளும் முடிவுகள் மிக முக்கிய பங்கு வகிக்கும். நீங்கள் ஏதேனும் செயற்பாட்டை முன்னெடுப்பதற்கு தயாராகும் பொழுது அச்செயற்பாட்டை முழு மனதுடன் முன்னெடுக்க வேண்டும். எந்தவொரு நொடியிலும் உங்களுடைய குறிக்கோள் தாமரை இலை மீது நீர்குமிழ் போல என கருத வேண்டாம். உங்கள் செயற்பாட்டின் வெற்றியை மனதார உணருங்கள். எத்தகைய தடைகள் வந்தாலும் உங்கள் பயணத்தை நிறுத்த மாட்டேனென உறுதிபூணுங்கள். உங்களால் முடிந்த ஒவ்வொரு சந்தர்பத்திலும் வாழ்வினை வெற்றிக் கொண்ட பெரியோர்களின் வாழ்வை வரலாற்றை வாசிக்க நேரத்தை ஒதுக்குங்கள். இது குறிக்கோளில் வெற்றியடைய உங்கள் மனதிற்கு மாபெரும் சக்தியாக அமையும். அப்பொழுது சரியான முடிவுகளே உலகில் மாற்றங்களை ஏற்படுத்தின மாறாக பிழையான முடிவுகள் அல்ல என்பதனை நீங்கள் விளங்கிக்கொள்வீர்கள். பெரும்பாலன சந்தர்பங்களில் நாம் துணிச்சலான முடிவுகளை மேற்கொள்வதற்கு பயப்படுகின்றோம். உலகை வென்றோர் தொடர்பில் ஆராய்யும் பொழுது அவ்வொவ்வருவருள்ளும் காணப்பட்ட மன உறுதி எமக்கு நன்கு புலப்படும். சவால்கள் மற்றும் துணிச்சலாக பிரச்சினைகளிற்கு முகங்கொடுக்கும் பொழுதே எம்முள் மன உறுதி வலுவடையும்.

### *உங்கள் இலக்கை கேந்திர நிலையமாக கொள்ளுங்கள்.*

எங்கள் வாழ்வில் பல வகையான மனிதர்களை சந்திக்கின்றோமல்லவா? நாளாந்தம் எவ்வளவு பிரச்சினைகளிற்கு முகங்கொடுக்கின்றோம்? எவ்வளவு புத்தகங்களை வாசிக்கின்றோம் ? அவற்றின் அடிப்படையில் உங்களுடைய குறிக்கோளை மாற்றியமைக்க முனைவீர்களாயின் உங்கள் தலை திரும்பும் திசைக்கெல்லாம் செல்ல நேரிடும். எனவே இலக்கை நோக்கி பயணிப்பது உங்களுடைய கடமையாகும். இரும்பு காந்தத்தை நோக்கி இழுப்படுவதைப் போன்று நீங்களும் உங்கள் இலக்கை நோக்கி பயணிக்க வேண்டும். நல்லெண்ணத்தின் பொருட்டு செயற்படுவதை சுயநல செயற்பாடாக கருத இயலாது. உங்கள் வாழ்க்கையின் செயற்பாடுகள் மற்றும் பொறுப்புக்கள் யாதெனில் இப்பூவுலகில் உங்களுக்கென ஒரு நன்மதிப்பை ஏற்படுத்துவதாகும். எனவே இச்சந்தர்பத்தில் உங்கள் குறிக்கோள் தொடர்பில் தெளிவாக புரிந்துக்கொள்ள வேண்டியது முக்கியமாகும். சில வேளை நாம் எம்முடைய குறிக்கோளை மறந்துவிடுவோம். பல்கலைகழகத்தில் என்னுடைய சில நண்பர்கள் நண்பிகள் தங்களுடைய குறிக்கோளை மறந்துச் செயற்பட்டமை என் நினைவிலுள்ளது. அவர்கள் பல்கலைகழகத்திற்கு வருகைத்தந்த நோக்கத்தை மறந்து வேறு பல செயற்பாடுகளில் ஈடுபட்டார்கள். இறுதியில் பட்டப்படிப்பை பூர்த்திச் செய்யாது பல்கலைக்கழகத்தை விட்டு வெளியேற நேரிட்டது. கற்றல் செயற்பாடுகளை முன்னெடுக்கும் உங்கள் பிள்ளைகளிற்கு இவ்விடயம் பற்றி எடுத்துரையுங்கள். ஒழுங்கற்ற முறையில் பல மணி நேரம் கல்வி பயிலும் பிள்ளையை காட்டிலும் ஒழுங்கான முறையில் தர்கம் புரிந்து கற்றல் செயற்பாடுகளை முன்னெடுப்பதற்கு பிள்ளைக்கு தேவையான சூழலை உருவாக்கி கொடுங்கள். ஏனெனில் ஒழுங்கான ஆய்வின் மூலம் உங்கள் குழந்தை பாட புத்தகத்திலுள்ள பாடங்களை கற்பது மாத்திரமே போதுமனாது.

### *குறிக்கோளிற்கான தனியான பயணத்தை எழுதிக்கொள்ளவும்.*

உங்கள் குறிக்கோளை மனதிற்கு நெருக்கமுடையதாக மாற்றுவதே உங்களின் வெற்றியாகும். நீங்கள் உங்கள் குறிக்கோளை பலப்படுத்தும் பொருட்டு நான் உங்களுக்கு சிறு உபாய மார்க்கத்தை கற்றுத் தருகின்றேன். வெள்ளை நிற தாளொன்றில் உங்கள் குறிக்கோளை தெளிவாக எழுதிக்கொள்ளுங்கள். இது மிகவும் பிரபல்யமான தனி நபர் விருத்தி செயற்பாடாகும். உங்கள் குறிக்கோளை அடைவதைற்கு இச்செயற்பாடு மாபெரும் உறுதுணையாக அமையும். நிரந்தரமும் கடதாசியில் எழுதியதை வாசியுங்கள். நீங்கள் குறிக்கோளை நோக்கி பயணிக்கும் விதம் கண்டு ஆச்சரியமடைவீர்கள்.

### *உரிய முறையில் திட்டம் தீட்டல.*

உங்களிடம் அதி விசேட குறிக்கோள் காணப்பட்ட போதிலும் அதற்கான உரிய திட்டமிடலை நீங்கள் கொண்டிருக்காவிட்டால் உங்களால் உங்கள் குறிக்கோளை சரிவர அடைய இயலாது. இது நடைமுறைச்

19 පිටුවට



by:- Natasha

# ග්‍රැන්ට්‍රි දොඹකර නඩත්තු අංශයේ සේවක සවියෙන් ඉදිවූ Hydraulic power press








ග්‍රැන්ට්‍රි දොඹකර නඩත්තු අංශයේ පරිපාලක (යාන්ත්‍රික) අජිත් කුමාර මහතා සහ කේ.ආර්. ප්‍රදීප් කුමාර මහතාගේ සංකල්පීය හා ශ්‍රම දායකත්වයෙන් නිමවූ Hydraulic power press යන්ත්‍රය තුළින් එම අංශයේ කටයුතු සඳහා ලබා දෙන දායකත්වය අතිමහත් ය. වැඩබිමේ ඉවතලන කොටස් උපයෝගී කර ගනිමින් ආයතනයට අවැසි මෙවැනි යන්ත්‍ර සූත්‍ර නිර්මාණයට යොමුවන සේවක ඔබට සමස්ථ සේවක කැල වෙනුවෙන් තීර්ථ ප්‍රණාමය පුදකර සිටින්නේ හදපිරි සතුටිනි.

# මාගම්පුර වරාය සේවක එකමුතුව මගින් ලේ දන්දීමේ සත්කාරයක්





සටහන -අශාන් සනුක

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මාගම්පුර සේවක එකමුතුව මගින් වාර්ෂිකව පවත්වනු ලබන ලේ දන්දීමේ සත්කාරය පසුගියදා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බුද්ධ ජයන්ති චෛතය පරිශ්‍රයේ දී අති සාර්ථක ලෙස සිදු කරන ලදී.


අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි සොයිසා මහතාගේ සහභාගීත්වයෙන් පැවති මෙම සත්කාරය උදෙසා සේවක මහත් මහත්මීන් 141 ක් පමණ ස්වකීය දායකත්වය ලබා දුන් අතර, මේ පොලවේ උපන් සැබෑ මිනිසෙකුගේ යුතුකම් හා වගකීම් දැයට දායාද කිරීම, උතුම් මනුෂ්‍යත්වය පිළිබඳ සහෘද ප්‍රජාව දැනුවත් කිරීම හා මාගම්පුර වරාය සේවය කළ හා වරාය අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ හෙට දවස යහපත් කිරීම උදෙසා ආශිර්වාද එක් කිරීම ද මෙම සත්කාරයේ මූලික අභිප්‍රාය විය.

# උතුරු නැගෙනහිර ප්‍රදීපාගාර 6ක් ප්‍රතිසංස්කරණයට පියවර


යුද්ධය නිසා විනාශ වූ හා දිරාපත් වූ උතුරු නැගෙනහිර ප්‍රදීපාගාර හයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනේ. මේ වන විය සාම්පූර් සහ පුන්කුඩතිව් ප්‍රදීපාගාර දෙකේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් අදියරේ පවතින අතර පේදුරුතුඩුව, කෝකිලායි, කන්කසන්තුරේ හා මේ වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති මුලතිව් ප්‍රදීපාගාර මේ වසර තුළ ප්‍රතිසංස්කරණය කර අවසන් කිරීමට කටයුතු කරනු ඇත.

# ஜயබහාළු සදහම් පොත් මැදුරෙන් නොමිලයේ ධර්මපොත් ලබා ගැනීමට ඔබටත් අවස්ථාවක්

ජයබහළු පර්යන්තයේ සඳහන් පොත් මැදුර වෙතින් බුදුදහම හා බැදුණු ධර්ම පොත්පත් නොමිලයේ ලබා ගැනීමට වරාය අධිකාරියේ සේවක ඔබ සැමට අවස්ථාව උදා වී ඇත. ඒ සඳහා ඔබ කළ යුත්තේ සඳහම් පොත් මැදුරේ සාමාජිකත්වය ලබා ගැනීම පමණි. වැඩි විස්තර සඳහා සඳහම් පොත් මැදුර කෘත්‍යාධිකාරි එස්. කුමාරසිංහ මහතා අමතන්න. දුරකථන 2353







# புத்ததாண்டில்....

18 පිටුවෙන්

சாத்தியமற்றதென ஒரு சில வேளை நீங்கள் நினைக்கலாம். நாங்கள் திட்டமிட்டு செயற்படாமையினால் எமக்கு இந்நிலை ஏற்படலாம். உரிய முறையில் திட்டம் தீட்டல் மிக முக்கியமாகும். நீங்கள் உரிய முறையில் உங்கள் திட்டத்தை தீட்டாவிட்டால் நீங்கள் பாரிய பள்ளத்தாக்கொன்றினுள் விழ நேரிடும்.

***உங்கள் மீது அன்பு செலுத்துபவர்களின் உதவியை மற்றும் ஒத்துழைப்பை பெற்றுக்கொள்ளல்உண்மையில்***

உங்கள் மீது அன்பு செலுத்துபவர்களின் உதவியை மற்றும் ஒத்துழைப்பை பெற்றுக்கொள்வது மிக முக்கியமாகும். உங்கள் மீது அன்பு செலுத்துபவர்களின் ஒத்துழைப்பினை பெற்றுக்கொள்வதன் மூலம் பயன் தரும் வகையில் வெற்றியடையும் முறைகளை கற்றுத்தரும் மற்றும் உதவிச் செய்யும் நண்பர்கள் இன்றும் எம் மத்தியில் இருக்கின்றார்கள். நண்பர்கள் மீது நம்பிக்கை வைத்து அவர்களின் அபிவிருத்தியின் பொருட்டு “சாட்சி“ கையெழுத்திட்டு பிரச்சினைகளிற்கு முகங்கொடுக்கின்ற கூட்டு வியாபார நடவடிக்கைகளை மேற்கொள்ளும் பொருட்டு தங்களுடை பணத்தை இழந்த எத்தனையோ பேரை நாம் கண்டுள்ளோம?

ஓய்வு பொழுதில் சீரான மன நிலையில் இவ்விடயம் தொடர்பில் சிந்தித்து பாருங்கள். உங்கள் வெற்றிக்கு உறுதுணையாகும் நண்பர்களை உங்கள் பயணத்தில் இணைத்துக்கொள்ளுங்கள். அப்பொழுது வெற்றிக்கான பயணத்தில் பலமடைவீர்கள். நண்பர்களை இணைத்துக்கொள்ளுங்கள். மற்றவர்களின் ஒத்துழைப்பினை நீங்கள் பெற வேண்டுமாயின் உங்கள் பொருட்டு ஒத்துழைப்பினையே வழங்குகின்றார்கள் என்பதை நினைவில்கொள்வது முக்கியமாகும்.

(மஹாபொல துறைமுகங்கள் மற்றும் சமுத்திரவியல் கலாச்சாலையினால் நடாத்தப்படுகின்ற Self-Motivation விரிவுரை நிகழ்வை அடிப்படையாகக் கொண்டு எழுதப்பட்டுள்ளது)



# සම්බුදු තෙමඟුල සමරා කොළොම්තොට
# සම්බුද්ධ ජයන්ති චෛත්‍ය පරිශ්‍රයෙන් ගැලූ දම් සිහිල





# මුදිත ධනන්ත

## සංගීතයේ ඔබ්බ සොයා යන තරුණ සංගීතවේදියා

සංගීතය දෙවියන් විසින් දුන් තිළිණයක් යැයි සැලකෙන්නේ එය එපමනටම මිහිරි වූත් අපූර්ව වූත් නිර්මාණයක් හෙයිනි. සංගීත ක්ෂේත්‍රයේ නියුතු ඇතැමෙක් ගායනයට දක්ෂය. අයෙක් වාදනයට දක්ෂය. තවත් අයෙක් තනු නිර්මාණයට දක්ෂය. මේ සියල්ලටම එකසේ දක්ෂයන් අල්පය. එවන් සොඳුරු සංගීතකාමියෙකු සහෘද සේවක ඔබ අතර සිටින බව ඔබ දන්නවා ද ? සංගීතයේ සියළු මානයන් ස්පර්ෂ කරන ඔහු නමින් මුදිත ධනන්ත හංවැල්ල ය.

**කොහොම ද ඔබ සංගීතයට යොමු වන්නේ...?**
අපේ ගෙදර සංගීත පරිසරයක් මගේ කුඩා කාලයේ ඉඳලාම පැවතුණේ. මාගේ තාත්තා සංගීතයට බොහොම දක්ෂයි. තාත්තා, එවකට ප්‍රවීන ගායන ශිල්පී චාන්දනී හෙට්ටිආරච්චි මහත්මියගේ ''චාන්දනී ඇන්ඩ් ද ක්ලෑන්'' සංගීත කණ්ඩයමේ ප්‍රධාන නියමුවා විදියට කටයුතු කළා. ඒ පසුබිම පුංචිම පුංචි කාලේ පටන් සංගීතයට මාව යොමු කළා. හය වසරේ දී තමයි මං ශාස්ත්‍රානුකූලව සංගීත විෂයට යොමු වෙන්නේ. ගල්කිස්ස ලලිත් ඇතුලත්මුදලි විද්‍යාලය මගේ සංගීත දිවියට යෝධ ශක්තියක් වුණා. පාසලේ සංගීත කණ්ඩායමේ නායකයා විදියට කටයුතු කළා. ඒ වගේම පාසැල් සංද්වනි කණ්ඩායමේත් මං සාමාජිකයෙක්. පාඨශාලාන්තර සංගීත තරගාවලිදීත් පළාත් මට්ටමින් දෙවරක් ප්‍රථම ස්ථාන දිනා ගැනීමට හැකිවුණා.

**කොහොමද ශ්‍රිතාල් සංගීත කණ්ඩායම බිහිවන්නේ...?**
පාසැල් කාලයේ අපි යාළුවන් කට්ටිය එකතු වෙලා ගැයු සමූහ ගීත වලට බොහෝම හොඳ ප්‍රතිචාර ලැබුණා. ඉතින් අපි හිතුවා අපි යාළුවෝ එකතු වෙලා සංගීත කණ්ඩායමක් පටන් ගත්තොත් හොඳයි කියලා. එහි අවසන් ප්‍රතිඵලයක් විදියට තමයි ශ්‍රිතාල් ශාස්ත්‍රිය ගීත රසවින්දනයට කැමති රසික ප්‍රජාව ඉලක්ක කරගෙන අපි මේ සංගීත කණ්ඩායම ආරම්භ කළේ . එය අප හිතුවාට වඩා බොහෝ දුරකට අපිව ගෙන ගියා. අද අපි හැමදෙනාම කාර්යබහුලයි. අපේ රැකියාවල ස්වභාවයත් එක්ක. ඒත්, අපි හැම සෙනසුරාදාම ගල්කිස්ස මහහෝටලයේ දී අපේ ශ්‍රිතාල් සමගින් සංගීතයේ නියැලෙනවා.

**කෙසේද ගීත නිර්මාණකරණයට යොමුවන්නේ...?**
පාසැල් කාලේ මගේ සංගීත ක්‍රියාකාරකම් පිළිබඳ මගේ සොයුරු කැළ වගේම ගුරු මහත්ම මහත්මීන් බොහෝම පැහැදීමෙන් කතා බහ කළා. ඒ ගැන අවට පාසැල්වල ගුරු භවතුන්ට පවා සැළවී තිබුණා. එහි ප්‍රතිඵලයක් ලෙසිනුයි මං ගල්කිස්ස උසස් බාලිකා විද්‍යාලයේ පාසැල් ගීතය සඳහා සංගීතය රචනා නිර්මාණය කරන්නට අවස්ථාව සැලසුනේ. එම පාසැල් ගීතයට බොහෝම ඉහළ ප්‍රතිචාර ලැබුණා. එහි ප්‍රතිඵලයක් ලෙසින් ප්‍රෙස්පටේරියන් බාලිකා විද්‍යාලයේ තේමා ගීතය නිර්මාණනය කරන්නටත් මට අවකාශය සැලසුනා. ඊට පස්සේ ගංගාරාමයේ බැති ගී සරණිය සංගීත අධ්‍යක්ෂණය ඇතුළු නිර්මාණ රැසකට දායකත්වය ලබා දුන්නා.

**ටවර්හෝල් නාට්‍ය පාසැලටත් ඔබ සම්බන්ධයි...?**
ඔව්, එහි විද්‍යාර්ථීන් විසින් නිර්මාණය කළ වේදිකා නාට්‍ය නිර්මාණ රැසක සංගීත අධ්‍යක්ෂණය කරන්නට මට අවස්ථාව ලැබුණා.

**අද දවස ගැන කතා කරමු...?**
අද දවසේ මම වරාය සේවකයෙකු වීමේ ඉමහත් තෘප්තිය විඳිනවා. මේ වගේ ජාත්‍යන්තර හා බැඳුණු ආයතනයකට සේවකයෙක් විදියට එකතු වෙන්න ලැබීම මගේ වාසනාවක් හැටියටයි මං සලකන්නේ. අද දවසේ මම මානව සම්පත් කොට්ඨාශයේ සේවය කරනවා. මේ මොහොතේ එහි සියළුම නිලධාරි මහත්ම මහත්මීන් හා සහෝදර සේවක මහත්ම මහත්මීන් ආදරයෙන් සිහිපත් කරනවා.

**ඔබේ හෙට දවස...?**
මේවන විට නිර්මාණ කිහිපයක් සඳහා සංගීත අධ්‍යක්ෂණය කරන්නට ආරාධනා ලැබී තිබෙනවා. ඒ කටයුතු සාර්ථක ලෙසින් ඉටු කිරීමට බලාපොරොත්තු වෙනවා. මගේ ඒකල ගායනා, වාදන ප්‍රසංගයක් පැවැත්වීමටත් කටයුතු සැලසුම් කරනවා. ඒ වගේම මට සප්ත ස්වරය කියාදුන් ආදරණීය අම්මා තාත්තා පවුලේ සියලු දෙනාම වගේම මගේ සංගීත ගුරුතුමිය ප්‍රදීපා ලියනරත්න මහත්මියත් මේ වෙලාවේ අදාරයෙන් සිහිපත් කරනවා.



සටහන -
නිම්නාද
මුතුකුඩආරච්චි

# අපේම අපේ ජනශ්‍රැතිය ප්‍රතිනිර්මාණය කරන වරායේ කලාකරුවා ඩබ්.එම්. සුරවීර


කොළඹ සුධර්ශී සිංහල සංස්කෘතික ආයතන සාමාජිකත්වයත්, ටෙලිවිෂ් ආයතනය මගින් වැඩ සටහන් ඉදිරිපත් කිරීම සහ රංගන කලාව පිළිබඳ ඩිප්ලෝමා හදාරා තිබීමත්, වේදිකාවේ හා ටෙලි නාට්‍ය රංගන දායකත්වයත් ඔහුගේ කලා ජීවිතය සාර්ථක කර ගැනීමට පිටුවහලක් විය. ඔහු විසින් අපේකම පෙරදැරි කරගත් ජන සංස්කෘතික උළෙලක් සංවිධානය කරන ලදී. මේ ඒ පිළිබඳ කෙටි විවරණයකි.

කල්‍යාණි ගංගා ස්වර්ණ ප්‍රභා කලා මංගල්‍ය පසුගියදා මල්වාන යබරලුව ග්‍රාමයේ දී පැවැත්වුණි. එහි මූලික අරමුණ වූයේ පුරවයේ ඓතිහාසිකත්වය, වර්තමානයට නොගැලපෙන මිත්‍යා මත, ආදී මානවයා කලාව හා බැඳි ඉතිහාසය, ලෝක ඉතිහාසයට එක්කල ටිකිරි කුමරු රාජසිංහගේ මුල්ලේරියාව සටනේ විශේෂ අවස්ථා විස්තර කිරීමත්, ගායනය රංගනය, නර්තනය සමගින් ප්‍රති නිර්මාණ කර පෙන්වීමත් ය.

තිළිණ විරාජ්ගේ සංගීත අධ්‍යක්ෂණයෙන් සකුණ ප්ලෑෂ් වාද්‍ය වෘන්දය සමග පැරණි ගීත 13 ක් පමණ කලා මංගල්‍යයේ ගායන ශිල්පි ශිල්පිනියන්ගෙන් ඇසීමට ලැබීමත් විශේෂත්වයක් විය. මෙය අලංකාර කරනු ලැබුවේ ගමේ සම්පත් උපයෝගී කර ගනිමිනි. එසේම කලාවට හිතකාමී ගමේ සියලු දෙනාගෙන් සහයෝගයෙන් බවත් මතක් කළ යුතුයි.







රාත්‍රි 8.30 පටන් ගත් කලා මංගල්‍යය හෝරා 4 1/2 ක පමණ කාලයක් සියලු දෙනා ඉතාමත් සතුටින් නැරඹීම් කළ බවත්, විශේෂයෙන් පාසැල් ළමුන්ට අධ්‍යාපන වැඩ සටහනක් වශයෙන් ද වැදගත් විය. ඉහත මාතෘකා විස්තර කරනු ලැබුවේ අපගේ නායක හිමි වහන්සේලා විසින් සහ මහාචාර්ය පොඩිනිලමේ (කොළඹ සෞන්දර්ය විශ්ව විද්‍යාලය) විසිනි. මෙහි විශේෂ අමුත්තන් වශයෙන් රංගනයෙන් දායක වූ රජතුමා, ආරච්චි මහතා සහ හාමිනේ, වෙද මහතා සහ වෙද හාමිනේ, පැලේ රාළ, ග්‍රෝතික ගම්මානකින් පැමිණි ග්‍රෝතික පවුලක් (ආදි මානවයා නියෝජනය කිරීම සඳහා) කැවුම්, කොකිස්, කිරිබත්, රස කැවිලි කඳක් පුරවා ගෙන එන, ගීත 03 කින් පසු පැමිණෙන කඳකරුවා ය.

එසේම විහාරස්ථානයට යායුතු පිළිවෙල රංගනයෙන් ද පෙන්වනු ලැබීය. (මල් වට්ටිය රැගෙන යා යුතු ක්‍රමය, ඇඳුමේ වර්ණය) එවැනි ආදර්ශමත් දේ පෙන්වමින් අලුත් නිර්මාණයක් ඉදිරිපත් කිරීමෙන් වර්තමාන මිනිසා පැරණි දේ අගය කරන නිසා ආරම්භයේ සිට අවසානය වනතෙක් රැඳී සිටීම මෙහි සාර්ථකත්වය ලෙස හැඳින්විය හැකි ය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නාවික කොට්ඨාශයේ නියමු ස්ථානයේ නැංගුරම්පොල පරිපාලක කෙනෙකු වශයෙන් සේවයේ යෙදී සිටින මා, ඉහත තනතුරේ රාජකාරියේ දී වරාය තුළ තිබෙන සියලු ජැටි වලට යාමට අවස්ථාවක් ලැබීමත්, SAGT සහ CICT ආයතන 02 ක සමගින් රාජකාරි සඳහා සම්බන්ධවීමට ලැබීමත් මතක් කරමින් ඉහත කලා නිර්මාණයන් කිරීමට මානසික හා මූල්‍යමය වශයෙන් එකම ශක්තිය වූයේ මාගේ මෙම රැකියාව බවත් සඳහන් කරමින් තීර්ථ පුවත්පතටත් ස්තුතිය පුද කරමි.

# කාව්‍යාංජලිය

තොටුපලේ කවිතොට

## අභිමානයයි ලක් දේශයේ

ඔබයි අපේ ජීවේ
රන් හදවත්
එකමුතු වී
තනයි මේ දැයේ
අභිමානේ
නිල් දියඹම
සින්න කරන්
මවයි දියේ
නෞකා වන්නම්
හෙට දවසේ
අපේ උරුමේ
රකිමු හදින් මුළු
එක්සත් වී

රේණුකා කුමාරි
ක්‍රියාකරවන කොට්ඨාශය

## ඉර බටු තරුව

අඳුරු රෑ තුන්යම
හැමදාම ඈත දිදුළන
ළඟට නෑවිත් දුර සිටි
ඉර බටු තරුව නුඹ මට
හීන වල අවසන
ළං කර ගන්න වෙහෙසුන
ඒත් ඈතින් උන්
ඉර බටු තරුව නුඹ මට
හැමදාම අහසට
නැගී මා දෙස බලමින
ළඟට එන්නට ලතැවුන
ඉරබටු තරුව නුඹ මට
යළිත් නොම යන්නට
ඇවිත් මා ළඟම නැවතුන
ඉදිරි මග පෙන්වන
ඉර බටු තරුව නුඹ මට

දිමුතු

## තම පුතු පාසලට ගිය පළමු දිනයේ මවකගේ සිතුවිලි

පුතුනි ඔබ පාසලට ගිය අද
දිනය හද තුල ලියැවුනා
සරස්වති දෙවි මවගේ බැල්මෙන්
සිනිදු ඔබේ පා එසවුනා
නිවස පාලුයි තනිකමක් විත්
ලය මඬල තුළ හිර වුණා
සිතේ සතුටින් පිරුණු කඳුලට
දුකේ කඳුලක් මුසු වුනා

වෙනදා එන ගේ කුරුල්ලන් ටික
අනෝදා අත්තක වසා
මොනවදෝ කිචි බිචි බලා
කිටිය හෙමිහිට ''ඥාවි' කියමින්
ඔබේ කාමරයට ගියා
කලු බලු සුරතලා බුරනවා
මගේ පුතු කොතන ද කියා

පුතුනි ඔබ පාසලට ගිය...
සරස්වති දෙවි මවගේ...

පන්තියේ සිට මදෙස බලමින්
හඬනවිට මා සැඟවුනා
ගේ පුරා දුවමින් කවන්නට
පොඩි පුතා තව පැමිණ නෑ
මට විවේකය ටිකක් ලැබුනත්
ඔබව එනතුරු සතුට නෑ
පොඩි පැටව් ටික කිරි කොකුන් මෙන්
ගෙදර එනතුරු සිහිය නෑ.../ /

වෛද්‍ය එස් සේරසිංහ
වෛද්‍ය කොට්ඨාශය

## ඈ සොයන මා

විඩාබර නෙත් සනසවන්නට
හැර බැලුවෙමි වා කවුළුවෙන්
ඈත නොපෙනෙන
සයුරු ඉම ළඟ
නෙත් නැවතුනා හරි සීරුවෙන්

සුන්දරයි ඇය දුරින් සිටි මුත්
මිරිඟුවක් සේ දිස්වෙමින්
පහස විඳිනට ඇගේ ගත ළඟ
බොහෝ ආශා දළුලමින්

ටිකෙන් ටික ඇය ළංව බැළු කළ
පෙනෙයි මට රූ රැජින මෙන්
බොහෝ දනනුන් කියයි වත ගොත
මගේ ආශා වඩවමින්

වරක් බැලුව ද තව තවත් වර
පහසු විඳිනට ඇගෙ සුවෙන්
නැවත බැලුවෙමි දිනක් ඇය දෙස
මදෙස නොබලා ඇය ගොසින්

එදා සිට ඇය අද තවම නැත
සිත හඬයි සෝ දුක් බරින්
විඩාවට තව කනස්සල්ලක්
එකතු වී ඇත ළතැවුලෙන්

ලක්මාල් පොතුහැර

## යසෝදරාවෝ රාහුල පුතු අමතයි

සුරතල් වදනින් සනහන කිරිකැටි රත්තරන් පුතේ
සම්බුදු පදවියෙන් පිදුව පියා ඈත එනව ඇතේ

සත් ලකුණෙන් රත් පැහැයෙන් බැබලෙන සිරිපා පියුමෙන්
පින්බර උත්තම පියාට වඳින්න බැතිබර හැඟුමෙන්

ලෝ වැඩ හිත සුව පිණිසම අත්හැරදා රජ සම්පත්
දන්නවාද නුඹේ පියා තුන් ලෝකෙට අග තැන්පත්

පුන්සඳ බඳු මුව මඬලයි දෙවියන් මිනිසුන් පිනවයි
ඇත් රජකුට බඳු ගමනයි එතුමා තිලොවට තිලකයි

දෙවියන් මිනිසුන් ඇවිදින් ඔබේ පියා පා වඳින්න
මගේ පුතේ ළඟට ගිහින් සම්බුදු සිරිපා සිඹින්න

සිල් සමාධි ගුණයන්ගෙන් සපිරුණ හොඳ හිතක් තිබේ
පුතේ ළගට යන්න නුඹට සඳහම් සිල් සුවඳ ලැබේ

දේදුන්නේ හැඩය ගත්ත නිල්වන් ඇහි බැම අගේය
දෙනුවන් මෙත් කරුණාවේ උල්පත බව මට හැඟේය

සිහ රජකුට බඳු සිරුරක් රන්වන් මුදු සමක් තිබේ
සම්බුදු රජු පියා උනේ පිනකිනි පුතණුවනි ඔබේ

සිනිඳු ගැඹුරු කන්කළු කටහඬක් තිබේ දම් දෙසන්න
රාහුල මගේ පුංචි පුතේ ළඟට ගිහින් බණ අසන්න

අඳුන් පැහැය ගත් නිල්වන් කෙස් ඇත සම්බුදු සමිදුට
දෙතිස් මහා පුරිස ලකුණු නැත මිහිපිට වෙන කෙනෙකුට

නිලබර තරු පිරිවැරු පුන්සඳ මෙන් බුදු හිමි එන්නේ
සඟ පිරිවර පියාගෙ සව්වන බව නුඹ නැහැ දන්නේ

පුත රාහුල, නුඹ ඉපදුන දින අබිනික්මනට ගියේ
සකල ලෝක සත්වයා මෙන් කරුණාවෙන්ය ළයේ

පියා ළඟට ගොස් සඳහම් දායාදය ඉල්ල ගන්න
අරහත් මඟ ඵල ලැබ ගෙන සසර දුකින් එතර වන්න

සාමා ගුණරත්න
මහනුවර ශාන්ත සිල්වෙස්තර විදුහලේ විශ්‍රාමික ආචාරිණී.

## එයින් උපදී කවිය ගීතය ....

අරුනළු හැඩවෙන
නැවුම් හිමිදිරියේ
තුරුපත් අතර නැගෙනා
කුරුළු නින්නාදයෙන්
සුපහන් විය උදා සිතිවිලි
ආදරණීය මිහිකත
අපූරුයි මේ සිහිල් මදනළ
ගලනා දියවැල් ය
පිපෙනා වන මල් ය
එතෙනා තුරුවැල් ය.
බැලු බැලූ අත ගණ නිල් ය...
කොන්ක්‍රීට් කුළුණු ද
වටකොට තැනූ පොකුණු ද
තව තව බොහෝ අරුම ද
නොමැති මුත් ගම
කොතෙක් සොඳුරු ද
ගඟුලින් නැගෙන සීතය
සිලි සිලි හඬින් තාලය
මීමැසි බඹර නාදය
එයින් උපදී කවිය ගීතය

දිනේෂා විතානගේ
අභ්‍යන්තර විගණක කොට්ඨාශය




''මිහිඳු සාදු පොසොන් දාක
ලංකාවට වැඩම කළා
තිස්ස තිස්ස තිස්ස කියා
රජතුමා ට කතා කළා''

වරාය දාරකාගාරයෙන්
ඇසුණු පොසොන් බැති
ගීසරණිය




**සීබ්‍රාවන්**
පසිඳු බිම්සර
9 ශ්‍රේණිය -අශෝක විද්‍යාලය, කොළඹ



**තට්ටු දෙකේ බස් රථය**
රනුග මනුමිත
රන්මුතු පෙර පාසල, කලගෙඩිහේන.



**වෙල් යායක්**
මනුග නෙත්මිර
6 ශ්‍රේණිය, සිද්ධාර්ථ කුමාර ම.වි. ගම්පහ



**කෝච්චිය**
සෙතුන් නෙත්මිර
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල්වත්තක්**
බිහඳු සස්විරු
දාරකාගාරය -වරාය අධිකාරිය



**පොල් වත්ත**
මදා
දාරකාගාරය -වරාය අධිකාරිය



**ගෙවත්ත**
සිතුම් සෙනලතා
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල්වත්ත**
තෙනුක
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල්වත්ත**
යෙනුක
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල් වත්ත**
සිතුමි
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල් වත්ත**
ඉන්ගා
දාරකාගාරය -වරාය අධිකාරිය




**මල් වත්ත**
දෙව්ජා බිනුසරි
දාරකාගාරය -වරාය අධිකාරිය



**මල් වත්ත**
සෙනුල රන්දුල
දාරකාගාරය -වරාය අධිකාරිය



**අපේ ගෙදර**
සනුගි ප්‍රනීපා
1 ශ්‍රේණිය -ගාමිණී ජා. පාසල, බෙන්තොට



**හදිසි අනතුරක්**
උසර මේනුජ
3 ශ්‍රේණිය -රාහුල ප්‍රා. විද්‍යාලය, මාතර



**මුහුදු වෙරළ**
තවිස් රත්නායක
දාරකාගාරය -වරාය අධිකාරිය



**වැස්සක්**
සෙහන්සා
දාරකාගාරය -වරාය අධිකාරිය

# ආසියාවේ පස්වැනි තැනට හිමිකම් කියූ වරායේ වොලිබෝල් කණ්ඩායම



සටහන -උපුල් ගුරුගේ

පැය 2 විනාඩි 25 ක් පුරා ඇදුණු තරගයකදි සත්කාරක තායිවාන ක්‍රීඩා සමාජ කණ්ඩායම වට 3-2 කින් පරාජයට පත් කරමින් ආසියානු ක්‍රීඩා සමාජ වොලිබෝල් (පිරිමි) තරගාවලියේ පස්වැනි ස්ථානය හිමිකර ගැනීමට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එම තරගාවලියට සහභාගී වූ වරාය අධිකාරිය කණ්ඩායම සමත් විය.

ලකුණු 25/16, 20/25, 24/26, 25/21 හා 15/09 ක් ලෙස තායිවාන ක්‍රීඩා සමාජ කණ්ඩායමට එරෙහිව ශ්‍රී ලංකා වරාය ක්‍රීඩකයෝ තරගය ජය ගත් හ.

1989 සිටි ශ්‍රී ලංකා චීන තායිපේ සමග වොලිබෝල් තරගමාලා සඳහා සහභාගි වුව ද තායිවාන කණ්ඩායමත් ශ්‍රී ලංකා කණ්ඩායමක් හමුවේ පරාජයට පත් වූ පළමු අවස්ථාව මෙය ලෙස සැලකේ. එය ආසියානු ජ්‍යෙෂ්ඨ බාණ්ඩයේ වොලිබෝල් තරගාවලියක ශ්‍රී ලංකාව ලබාගත් ඉහළම ස්ථානය ලෙස සැලකේ.





තායිපේ නුවර දී පැවති මෙම තරගාවලිය සඳහා සහභාගි වූ රටවල් ගණන 16 කි. ශ්‍රී ලංකාව මීට පෙර තමන් සත්කාරය දැරූ 2014 ආසියානු යොවුන් වොලිබෝල් (පිරිමි) තරගාවලියේ දී පස්වැනි ස්ථානය ලබා ඇත. කෙසේ වුවත් එය කණිෂ්ඨ තරග බාණ්ඩයට අයත් තරගාවලියකි.

මේ වන විට අන්තර්ජාතික වොලිබෝල් (පිරිමි කණ්ඩායම්) ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකාව 131 වැනි ස්ථානයේ පසුවේ. චීන තායිපේ 35 වැනි ස්ථානය දක්වා ඉදිරියට පැමිණි තිබෙන රටකි. ආසියානු ශ්‍රේණිගත කිරීම් අනුව ද චීන - තායිපේ රටවල් 56 කින් 7 වන ස්ථානය දක්වා ඉහළ ස්ථානයක පසුවන අතර ශ්‍රී ලංකාව පසු වන්නේ 14 වැනි ස්ථානයේ ය. ශ්‍රී ලංකාව නියෝජනය කළ වරාය කණ්ඩායම ලැබූ මෙම ජයග්‍රහණය වඩාත් සුවිශේෂි වන්නේ මෙවන් වටපිටාවක් තුළ ය.



වරාය කණ්ඩායමේ ජනිත් සුරත් තරගාවලියේ වේගවත්ම ඩෑෂ් පහර එල්ල කළ ක්‍රීඩකයන් පස්දෙනා අතරට ද ඇතුළත්ව සිටීම කැපී පෙනේ. තායිවාන ක්‍රීඩා සමාජ කණ්ඩායමට එරෙහිව ජනිත් සුරත් පිටියේ පසුපස සිට එල්ල කළ එක් ඩෑෂ් පහරක වේගය පැයට කිලෝමීටර් 96 ක් ලෙස සටහන්ව තිබේ. තරගාවලියේ වේගවත්ව ඩෑෂ් පහර එල්ල කළ ක්‍රීඩකයාගේ වේගය පැයට කිලෝමීටර් 107 කි.

වරාය කණ්ඩායමේ නායක දර්ශන කුමාර ඇතුළුව ලසිඳු නෙත්මල් වසන්තප්‍රිය සහ නිලන්ත සංජයගේ දස්කම් ද තරගාවලිය පුරා කැපී පෙණුනි.

තරගාවලියේ දී තායිවානයට එරෙහි තරගය මෙන්ම තර්ක්මෙනික්ස්ථානය (3/2) ඉන්දුනීසියාව (3/2) වියට්නාමය (3/1) හා ඕස්ට්‍රේලියානු (3/1) යන ක්‍රීඩා කණ්ඩායම්වලට එරෙහිව පැවති තරග ද ජය ගත්තේ ය.

වරාය අධිකාරිය කණ්ඩායමේ පුහුණුකරු ලෙස උදය රැක්මාල් මහතාත් කළමණාකරු ලෙස උපාලි ගමගේ මහතාත් කටයුතු කලහ.

ජයග්‍රහණයට නායකත්වය දුන් කණ්ඩායමේ නායක දර්ශන කුමාර ස්වකීය මතකයන් අවදි කළේ මේ ලෙසින්,

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කණ්ඩායම ලෙසින් ජාත්‍යන්තර තලයේ ජයග්‍රහණයකට හිමිකම් කියන්නට ලැබීම වරාය අධිකාරියේ සියලුම සේවක මහත්ම මහත්මීන් ලැබූ ජයක් හැටියටයි අපි සලකන්නේ. මෙම තරගාවලිය සඳහා වරාය අධිකාරියෙන් හොඳ සහයෝගයක් අපට ලැබුණා. විශේෂයෙන් නිරතුරුවම අපේ කටයුතු සොයා බලා

**අපේ කණ්ඩායමේ හැම දෙනාම දක්ෂයි. ඒ වගේම අපි නිරතුරුවම කණ්ඩායමක් ලෙසින් කටයුතු කරනවා. උදය රැක්මාල්, සමීර දිසානායක වගේ ප්‍රවීණතමයන් වගේම ජනිත සුරත් වැනි ජාත්‍යන්තර මට්ටමේ සම්පත් එකතුවකින් අපේ කණ්ඩායම සමන්විත වෙනවා.**

අපව දිරි ගන්වන වීරසිංහ මහතා ප්‍රතිපාදන ලබාදීමට මැදිහත් වුණා. අපේ කණ්ඩායමේ හැම දෙනාම දක්ෂයි. ඒ වගේම අපි නිරතුරුවම කණ්ඩායමක් ලෙසින් කටයුතු කරනවා. උදය රැක්මාල්, සමීර දිසානායක වගේ ප්‍රවීණතමයන් වගේම ජනිත සුරත් වැනි ජාත්‍යන්තර මට්ටමේ සම්පත් එකතුවකින් අපේ කණ්ඩායම සමන්විත වෙනවා. 2006 වසරේ කණිෂ්ඨ තරගාවලියට සහභාගි වූ බොහෝ දෙනෙක් අද කණ්ඩායමේ සිටිමින් මේ ජයග්‍රහණයට උරදීම විශේෂ කාරණාවක් හැටිය හඳුන්වන්න මං කැමතියි. ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායමට ලබා ගත නොහැකි වූ ජයග්‍රහණයක් අපේ වරාය අධිකාරි කණ්ඩායම ලබා ගැනීම තුළ අපේ කණ්ඩායමේ එකමුතුව වගේම සහයෝගය තුළින් දක්ෂතාවය කරා යාමට අපිට හැකිවීම ගැන ඇත්තටම බොහෝම සන්තෝෂයි. ඒ වගේම අපි ලැබූ ජයග්‍රහණය මහත් හරසරින් පිළිගෙන අපිව ඇගැයීම පිළිබඳ සභාපතිතුමා ප්‍රමුඛ කළමණාකාරීත්වයටත් අපගේ සමස්ථ කණ්ඩායමේ ම ගෞරවය පුදකර සිටිනවා.

තරගාවලියේ කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් ක්‍රීඩක ජනිත සුරත් තමා ලැබූ අත්දැකීම් තීර්ථ වෙත හෙළි කළේ මේ ලෙසින්.

''ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවටයි ආසියාවේ පස්වන ස්ථානයට අපි රටක් විදියට පැමිණියේ. ඒ කටයුත්ත සඳහා අපමණ දායකත්වයත්, සහයෝගයක් ලබා දුන් වීරසිංහ මහතා ඇතුළු ක්‍රීඩා සංගමයේ සියලු නිලධාරි මහතුන් වගේම කළමණාකාරීත්වයටත් අප කණ්ඩායමේ ප්‍රණාමය හිමිවිය යුතුයි කියා මං විශ්වාස කරනවා. මේ තරගාවලියේ අපගේ කණ්ඩායමේ හැමෝටම අවශ්‍ය වුණේ හොඳ තරගයක් දෙන්න. ජයග්‍රහණය කරා යන්නට අපි කිසිකෙනෙක් පුද්ගලික ජයග්‍රහණ බලාපොරොත්තු වුණේ නැහැ. නමුත්, මට මේ තරගාවලියේ දී ජාත්‍යන්තර මට්ටමේ වේගවත්ම ඩෑෂ් කරුවන් පස්දෙනා අතරට එක්වෙන්නට අවස්ථාව ලැබුණා. මේ තරගාවලියේ දී අපි හැම දෙනාම හොඳින් ක්‍රීඩා කළා. එක තරගයක් ඉවර වෙලා අපි හැම දෙනාම එකතු වෙලා ඊළඟ තරගය පිළිබඳ සාකච්ඡා කළා. අපේ පුහුණුකරුවන්, අපේ නායක දර්ශන කුමාර ඇතුළු හැමදෙනාම මේ කටයුත්තේ දී බොහෝම ඉහළ දායකත්වයක් ලබා දුන්නා.

කොළඹ 10, බෝධිරාජාරාම මාවතේ, අංක 06 පිහිටි, සී/ස ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ආයතනය මගින් මුද්‍රණය කරවා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදී.